තිරසර සංවර්ධන, වනජීවී හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
வலுவாதார அபிவிருத்தி, மற்றும் வனசீவராசிகள்
பிராந்திய அபிவிருத்தி அமைச்சு
தேசிய தாவரவியல் பூங்காக்கள் திணைக்களம்
**Ministry of Sustainable Development, Wildlife and Regional Development**
**Department of National Botanic Gardens**

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2017
# வருடாந்த முன்னேற்ற அறிக்கை 2017
# Annual Performance Report 2017


**ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, තැ.පෙ.14, පේරාදෙණිය**
தேசிய தாவரவியல் பூங்காக்கள் திணைக்களம், த.பெ.14, பேராதனை.
**Department of National Botanic Gardens, P.O. B. 14, Peradeniya**

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# 2017

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

තැ.පෙ.14, පේරාදෙණිය

# පටුන

---


1. හැඳින්වීම 04

2. 2017 වසරේදී ලැබූ ප්‍රගතිය 11

3. ආදායම 12

4. මූල්‍ය වැය ප්‍රගතිය 13

5. 2017 වර්ෂයේ උද්භිද උද්‍යානයන් හි සිදු වූ සංවර්ධන වැඩසටහන් 18

6. දෙපාර්තමේන්තුව යටතේ සෙසු ඒකකවල කළමණාකරනය 39

7. 2017 වර්ෂය තුල තනතුරු ඇති කිරීම්, බඳවා ගැනීම්, ස්ථාන මාරු, මුදා හැරීම්, විශ්‍රාම ගැනීම් සහ මිය යාම් 41

8. කාර්ය මණ්ඩල පුහුණුව සහ හැකියාව ගොඩනැංවීම 42

9. 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම 44

# කාර්ය සාධන වාර්තාව 2017
## ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

## 1. හැඳින්වීම

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, උද්භිද විද්‍යාත්මක කටයුතු සම්බන්ධ ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුරෝගාමී ආයතනය වේ. මෙය ශාක විතැන් සංරක්ෂණය, ශාක පිළිබඳ අධ්‍යයන කටයුතු, ශ්‍රී ලංකාවේ උද්‍යාන අලංකරණ විද්‍යාව ප්‍රවර්ධනය සඳහා පර්යේෂණාත්මක සහ තාක්ෂණික වැඩසටහන්, මල්වගා පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා විශාල දායකත්වයක් ලබාදෙන අතර දෙස් විදෙස් සංචාරකයින් ගේ ආකර්ෂණීය ස්ථානයක් ද වේ.

ප්‍රධාන උද්භිද උද්‍යාන වන පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය (1821), හක්ගල උද්භිද උද්‍යානය (1861), ගම්පහ පිහිටි හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය (1876) සහ ගනේවත්ත වන ඖෂධ උද්‍යානයට අමතර ව මෑත කාලයේදී පිළිවෙළින් 2013 සහ 2015 වර්ෂයන් හි හම්බන්තොට මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය සහ අවිස්සාවේල්ල සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය මහජනතාවට විවෘත කරන ලදී.

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ නඩත්තුවන උද්භිද උද්‍යාන තුළ ශාක විශේෂ 4500 කට අධික ප්‍රමාණයක් සංරක්ෂණය වී ඇති අතර දුර්ලභ ශාක, වනාන්තර තුළින් වඳ වී ගොස් ඇති ශාක, ශ්‍රී ලංකාවට පමණක් ආවේණික ශාක, වඳ වීමේ තර්ජනයට ලක් වී ඇති ශාක විශේෂ රාශියක් මෙම සංරක්ෂිත ශාක අතරට ඇතුළත් ය. මෙම උද්භිද උද්‍යානවලට අමතරව ගනේවත්ත වන ඖෂධ උද්‍යානය ශ්‍රී ලංකාවේ ඖෂධ ශාක සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම පිණිස දායක වේ.

උද්භිද විද්‍යාත්මක සහ ශාක වර්ගීකරණ පර්යේෂණ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් මෙන් ම ශාක පිළිබඳ විවිධ නිගමනයන් සහ සත්‍යබව තහවුරු කිරීමේ කාර්යයන් ද කරනු ලබන්නේ ජාතික ශාකාගාරයෙනි. මල්වගා සංවර්ධන සහ පර්යේෂණ අංශය විසින් මල්වගා පර්යේෂණ සහ විවිධ වැඩසටහන් මඟින් මල්වගා සංවර්ධන කටයුතු සිදුකරමින් ඒ හරහා රට තුළ මල්වගා ක්ෂේත්‍රය ප්‍රවර්ධනය සිදුකෙරේ. කෙටිකාලීන පුහුණු පාඨමාලා, එක් අවුරුදු සහ දෑ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවන් සහ අනෙකුත් අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් අධ්‍යාපන සහ පුහුණු මධ්‍යස්ථානය මඟින් සිදුකරනු ලබයි.

මහජනතාවට විනෝදාස්වාදය ලබා දීම, ලොව පුරා ශාකවල විවිධත්වය සහ ශාක රාජධානියේ අලංකාරීත්වය රස විඳීමට ඉඩ ප්‍රස්ථා ලබා දීම, ශාක පිළිබඳ දැනුම ලබා දීම හරහා ශාක ප්‍රජාව වෙත ඔවුන් සමීප කරවීම ද ජාතික උද්භිද උද්‍යාන තුළින් සිදුවන මහඟු කාර්යයකි.

### 1.1. දැක්ම

උද්භිද විද්‍යාත්මක හා සෞන්දර්යාත්මක කටයුතු උසස් මට්ටමකින් පවත්වාගනිමින් නිවර්තන කලාපීය හොඳම උද්භිද උද්‍යාන බවට පත් වීම.


### 1.2. මෙහෙවර

ස්වභාවික සහ නිර්මිත පරිසරයන් තුළ ඇති ශාක සම්පත් අධ්‍යයනයට, තිරසාර සංරක්ෂණයට, අගය කිරීමට මහජනතාවට අවස්ථාව සලසා දෙමින් ඔවුන් ශාක වෙත සමීප කරවීම.

## 1.3. ප්‍රධාන කාර්යයන්

1. ශ්‍රී ලංකාවේ ශාක විවිධත්වය සංරක්ෂණය කිරීමෙහිලා විතැන් සංරක්ෂණ ක්‍රමවේද සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම.
2. අධ්‍යාපන හා සන්නිවේදන ක්‍රමවේද උපයෝගී කරගනිමින් ශ්‍රී ලංකාවේ ශාක සම්පත් පිළිබඳ ව හා ශාක සම්පත් බැඳී පවත්නා විවිධ වූ කර්මාන්ත සඳහා අවශ්‍ය වන්නා වූ නිවැරදි තොරතුරු හා ශිල්පීය ඥානය ලබා දීමට වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
3. ශ්‍රී ලංකාවේ මල්වගා කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍යවන්නා වූ විවිධ පර්යේෂණ හා තාක්ෂණ ක්‍රමවේද අත්හදා බැලීම හා ක්‍රියාවට නැංවීම.
4. ශ්‍රී ලංකාවේ ජාතික උද්භිද උද්‍යාන උසස් මට්ටමකින් පවත්වාගෙන යාම.
5. සුදුසු ස්ථානවල නව උද්භිද උද්‍යාන පිහිටුවීම සඳහා අවශ්‍යවන්නා වූ සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම.
6. අලංකරණ උද්‍යාන විද්‍යාව ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ හා තාක්ෂණ වැඩසටහන් ක්‍රියාවට නැංවීම
7. ශ්‍රී ලංකාවේ හඳුනාගත් ඓතිහාසික වටිනාකමකින් යුත් වෘක්ෂලතා සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණ උපදෙස් ලබා දීම.
8. අනුරාධපුර ජය ශ්‍රී මහබෝධීන් වහන්සේගේ සෞඛ්‍ය, ආරක්ෂාව යහපත් ව පවත්වාගෙන යාම.

## 1.4.සංවිධාන සැලැස්ම




** රා.උ.උ. - රාජකීය උද්භිද උද්‍යානය

ස.අ. කාර්යාලය - සහකාර අධ්‍යක්ෂ කාර්යාලය

තෙ.ක.උ.උ. - තෙත් කලාපීය උද්භිද උද්‍යානය

වියළි ක.උ.උ.- වියළි කලාපීය උද්භිද උද්‍යානය

## 1.5. කාර්ය මණ්ඩල විස්තර

දෙපාර්තමේන්තුව සඳහා අනුමත සේවක සංඛ්‍යාව 974 ක් වන අතර, 2017.12.31 දින වන විට 630 දෙනෙකු සේවයේ යෙදී සිටි අතර ඒ පිළිබඳ ව සාරාංශයක් පහත දැක්වේ.

### 1.5.1. 2017.12.31 දිනට දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු

| සේවක ගණය | වැටුප් ක්‍රමය | සේවය/තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | SL - 3<br>SL - 1 | ශ්‍රී.ලං.වි.සේ<br>ශ්‍රී.ලං.පරි.සේ<br>ශ්‍රී.ලං.ගණ.සේ<br>ශ්‍රී.ලං.ක්‍රම ස.සේ<br>ශ්‍රී.ලං.ඉං.සේ<br>ශ්‍රී.ලං.වා.වි.සේ | 34 | 16 |
| තෘතීය මට්ටම | MN – 7<br><br>MN – 6 | පරිපාලන නිලධාරී<br><br>ශ්‍රී.ලං.තා.සේ/විශේෂ පංතිය<br>භාෂා පරිවර්තක | 10 | 04 |
| ද්විතීය මට්ටම | MN – 4<br><br><br><br>MN – 3<br><br><br><br><br><br>MN – 2<br><br>MN – 1<br><br>MT – 1 | වැඩසටහන් සහකාර<br>සංවර්ධන නිලධාරී<br>කෘෂි මෙහෙයුම් නිලධාරී<br><br>කෘෂි උපදේශක<br>උද්‍යාන සංවර්ධන සහකාර<br>පර්යේෂණ සහකාර<br>ශ්‍රව්‍ය දෘෂ්‍ය සහකාර<br>කාර්මික නිලධාරී<br><br>රාජ්‍ය කළමනාකරණ සේවය<br><br>ගාස්තු අයකිරීමේ සහකාර<br><br>තොරතුරු තාක්ෂණ සහකාර<br>උද්‍යාන වැඩ මූලික<br>උද්‍යාන කොන්දොස්තර | 189 | 130 |
| ප්‍රාථමික මට්ටම | PL – 3<br>PL – 2<br>PL – 1 | ශිල්පීය<br>අර්ධ ශිල්පීය<br>ශිල්පීය නොවන | 741 | 480 |
| එකතුව | | | 974 | 630 |

**1.5.2.** **දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය**

| තනතුර | නිලධාරියාගේ නම |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | කේ.එන් යාපා මයා |
| අධ්‍යක්ෂ (සංවර්ධන) | එච්.සී.පී.ජයවීර මිය |
| අධ්‍යක්ෂ (පාලන) | අයි.ඩබ්.එම්.සී.කේ ඉලංගකෝන් මිය |
| ප්‍රධාන ගණකාධිකාරී | ඩබ්.ටී.යූ ද මැල් මයා |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | එන්.ටී ලියනගේ මිය |
| ගණකාධිකාරී | ඩී.එම් වීරසේකර මයා |
| ඉංජිනේරු (සිවිල්) | ඒ.එල්.එම් මාහිර් මයා |
| සහකාර අධ්‍යක්ෂ (පාලන) | වයි.එම්.වයි යාපා බණ්ඩාර මයා |
| සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | එච්.ජී ජයසේකර මයා |
| පරිපාලන නිලධාරි | එච්.ආර්.එම්.ඒ.එම් රත්නායක මිය |

**1.5.3.** **දෙපාර්තමේන්තු උප කාර්යාල වල ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය**

| තනතුර | නිලධාරියාගේ නම |
|---|---|
| අධ්‍යක්ෂ (පර්යේෂණ හා තාක්ෂණ ප්‍රචාරණ) - මල්වගා පර්යේෂණ අංශය | ආචාර්ය ශෙලෝමි ඒ. ක්‍රිෂ්ණරාජා මෙනවිය |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ - රාජකීය උද්භිද උද්‍යානය | ආචාර්ය ඒ.එම්.ඒ.එස් අත්තනායක මිය |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ - මල්වගා පර්යේෂණ අංශය | එම්.එම්.ඩී.ජේ සේනාරත්න මයා |
| සහකාර අධ්‍යක්ෂ - ගම්පහ උද්භිද උද්‍යානය | එම්.සී වික්‍රමසිංහ මිය |
| සහකාර අධ්‍යක්ෂ - සහකාර අධ්‍යක්ෂ කාර්යාලය, නාරාහේන්පිට | ආර්.එස්.ඩබ් ගෝමස් මිය |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ - ජාතික ශාකාගාරය | ආචාර්ය ආර්.ඒ.එස්.ඩබ් රණසිංහ මිය |
| සහකාර අධ්‍යක්ෂ - සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය | පී.ඩී.එස් විජේරත්න මයා |

## 1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන සහ ඒකක

### පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය

1821 දී ස්ථාපිත පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය, ශ්‍රී ලංකාවේ ආර්ථික සහ පාරිසරික සංවර්ධනය සඳහා දායකත්වය ලබා දෙමින් ශාක පිළිබඳ අධ්‍යයනයට හා පැළෑටි සංරක්ෂණයට දායකත්වයක් ලබා දෙයි.

හෙක්ටයාර 61.25ක් වූ උද්‍යානය මහනුවර නගරය සමීපයෙහි පිහිටා ඇති අතර, ශාක අධ්‍යයනයට, උද්භිද හා පරිසර විද්‍යාත්මක පර්යේෂණයන්ට, අලංකරණ උද්‍යාන බෝග වගා ප්‍රදර්ශනයට මෙන් ම විනෝදාස්වාදය ලබා දෙන ස්ථානයක් ලෙස ප්‍රචලිත ය.

### ජාතික ශාකාගාරය

ජාතික ශාකාගාරය ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ශාකවල වියළි ශාකාගාර නිදර්ශක එක් රැස් කර ඇති ස්ථානයකි. මෙහි වෙනත් බොහෝ විදේශික ශාක සහ අනෙකුත් වගා කරන ශාකවල නිදර්ශක ක්‍රමානුකූල අධ්‍යයනය සඳහා ආරක්ෂා කර ඇත. 160,000 ආසන්න ශාකාගාර නිදර්ශක යෝග්‍ය තත්ත්වයන් යටතේ සංරක්ෂණය කරමින් විමර්ශන කාර්යයන් සඳහා තබා ඇත. 3,500 පමණ ග්‍රන්ථ සහ සෙසු ශාක හා සම්බන්ධ වූ පොත් පත්, සඟරා ද ශාකාගාරයේ දී ලබා ගත හැක.

ශාකාගාරයේ තැන්පත් කර ඇති නිදර්ශක ශාක වර්ගීකරණ, පර්යේෂණ සඳහා මෙන් ම ජෛව විවිධත්ව දත්ත බැංකුවක් ලෙස ශාක හඳුනා ගැනීමේ කාර්යයන් සඳහා යොදා ගනී.

### හක්ගල උද්භිද උද්‍යානය

හක්ගල උද්භිද උද්‍යානය වර්ෂ 1861 දී ආරම්භ කරන ලද අතර, උද්‍යානයට අයත් බොහෝ ශාක සෞම්‍ය කලාපීය ශාක වේ. මෙම ශාක එකතුව ශ්‍රී ලංකාවට ආවේණික ශාකවල මෙන් ම වෙනත් රටවලින් හඳුන්වා දුන් කඳුකර ශාකවල එකතුවකි. මේවා උද්‍යානයේ විවිධ අංශවල ක්‍රමානුකූලව රෝපණය කර ඇත.

### හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය

ශ්‍රී ලංකාවේ රබර් වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය 1876 දී ස්ථාපිත කරන ලදී. ඉතා පැරණි ඉතිහාසයක් ඇති එය උද්භිද විද්‍යාත්මකව හා උද්‍යාන විද්‍යාත්මක වශයෙන් ආකර්ෂණීය ස්ථානයකි. එය ගම්පහ පිහිටා ඇති අතර, වපසරිය හෙක්ටයාර 17.4 කි. ශ්‍රී ලංකාවේ සහ සෙසු රටවල ශාක විශේෂයන් 2000 ක පමණ සංකලනයකින් මෙම උද්‍යානය සමන්විත වේ.

### මල්වගා පර්යේෂණ හා සංවර්ධන ඒකකය, පේරාදෙණිය

මල්වගා පර්යේෂණ සහ සංවර්ධන ඒකකය, මල්වගා සම්බන්ධ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම සහ ශ්‍රී ලංකාවේ මල්වගා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා කැපවී සිටී.

වගාකරුවන් සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍ර උපදේශන සේවා හා ආයෝජන අවස්ථා පිළිබඳ ව තොරතුරු සැපයීම, උපකරණ සහ තත්ත්වයෙන් උසස් රෝපණ ද්‍රව්‍ය ලබා දීම සඳහා ඒකකය ක්‍රියාකාරීව දායක වේ.

### ගනේවත්ත වන ඖෂධ උද්‍යානය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගනේවත්ත වන ඖෂධ උද්‍යානය පිහිටා ඇත. උද්‍යානය හෙක්ටයාර 21.04 ක වපසරියකින් යුක්ත වන අතර, ඖෂධ පැළෑටි සංකලනය විශාල පරාසයක පැතිරී ඇත. ගනේවත්ත වන ඖෂධ උද්‍යානය පහසුවෙන් සොයා ගත නොහැකි දුර්ලභ ඖෂධීය පැළෑටි වර්ග සංරක්ෂණය කිරීම, ඖෂධ පැළෑටි ක්‍රමවත්ව වගා කිරීම සහ පැළෑටි එකතු කිරීමේ ක්‍රම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමෙහි නිරත වී සිටියි.

### මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය

දේශීය විශේෂඥයින් විසින් අවුරුදු 130 කට පසු සැලසුම් කොට බිහි වූ ශ්‍රී ලංකාවේ ප්‍රථම උද්භිද උද්‍යානය වනුයේ මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානයයි. මෙම උද්‍යානය දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. සංවර්ධන වැඩ කටයුතු 2006 වර්ෂයේ ආරම්භ කෙරුණු අතර 2013 වර්ෂයේ දී මහජනතාවට විවෘත කරන ලදී .
වියළි සහ ශුෂ්ක කලාපීය ශාකවල විතැන් සංරක්ෂණය සහ ප්‍රාදේශීය ආර්ථිකය සංවර්ධනයට දායකවීම මෙම උද්‍යානයේ ප්‍රධාන අරමුණ වේ.

### සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය

අවිස්සාවේල්ල ප්‍රදේශය සමීපයෙහි මෙම උද්‍යානය පිහිටා ඇත. සංවර්ධන කටයුතු 2008 වසරේදී ආරම්භ කරන ලද අතර 2015 දී මහජනතාවට විවෘත කරන ලදී. උද්භිද උද්‍යානය හෙක්ටයාර 42.49 වපසරියකින් යුක්ත ය.
පහතරට තෙත් කලාපීය ශාකවල විතැන් සංරක්ෂණය කිරීම මෙම උද්‍යානයේ ප්‍රධාන අරමුණ වී ඇත.

### සුවහස් මල් සෙවන, කොළඹ

දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටි " සුවහස් මල්" මල්වගා සංගම්වල මල්වගා නිෂ්පාදන අලෙවිය හා තාක්ෂණ ප්‍රචාරණ කටයුතු, දෙපාර්තමේන්තුවේ ඒකකයක් වන නාරාහේන්පිට පිහිටි " සුවහස් මල් " ඒකකයෙන් සිදු කරනු ලබයි.

### අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අගමැතිතුමාගේ නිල නිවාස උද්‍යාන

අතිගරු ජනාධිපතිතුමාගේ කොළඹ, මහනුවර, නුවරඑළිය, අනුරාධපුරය පිහිටි නිල නිවාස උද්‍යාන සහ ගරු අගමැතිතුමාගේ කොළඹ සහ නුවරඑළිය ප්‍රදේශයේ පිහිටි නිල නිවාස උද්‍යාන දෙපාර්තමේන්තුව මගින් නඩත්තු කටයුතු සිදු කරනු ලබයි.

### පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන්

පළමු සහ දෙවන ලෝක යුද්ධ වලදී මිය ගිය පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ හමුදා සේවයට අයත් නිලධාරීන් සිහිවීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක මහනුවර, ජාවත්ත, බොරැල්ල සහ ත්‍රිකුණාමල ප්‍රදේශ වල පවත්වා ගෙන යයි. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව මගින් යුධ සොහොන් ඒකක උද්‍යානවල කළමනාකරණ කටයුතු සිදු කරනු ලබයි.

### හරිත පියස, මීගලෑව

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කි.මී. 96.56 දුරකින් මීගලෑව හරිත පියස පිහිටා ඇත. හරිත පියසෙහි වර්තමාන වපසරිය හෙක්ටයාර 2.43 කි. එය සංවර්ධනය වෙමින් පවතී. මල් වගාව පිළිබඳව අභ්‍යන්තර කාර්ය මණ්ඩලයට සහ දේශීය ජනතාවට පාඨමාලා පවත්වාගෙන යන හා ශාක ප්‍රචාරණය සිදුකරන මධ්‍යස්ථානයක් ලෙස ද ඉදිරියේ දී කටයුතු කරනු ඇත.


# 2. උද්භිද උද්‍යාන වෙත පැමිණි සංචාරකයින් සංඛ්‍යාව සහ ආදායම පිළිබඳ තොරතුරු - 2017

## 2.1. සංචාරකයන්ගේ පැමිණීම


2017 වසරේ දී ද ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් සියලු ම ඒකක ඉහළ මට්ටමකින් පවත්වා ගෙන යන ලදී.

මෙම වසරේ උද්භිද උද්‍යාන නැරඹීම සඳහා පැමිණි මුළු සංචාරකයන් සංඛ්‍යාව 2,837,554ක් වේ. මෙම සංචාරකයන්ගෙන් 2,397,347ක් දේශීය සංචාරකයින් වන අතර 440,207 ක් විදේශීය සංචාරකයින් වේ.

## 2.2. 2017 වසරේ දී උද්භිද උද්‍යාන නැරඹීම සඳහා පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාත්මක තොරතුරු




උද්‍යාන නැරඹීමට පැමිණි දේශීය විදේශීය සංචාරකයින් සංඛ්‍යාව




**2016 හා 2017 වසරවල දී උද්‍යාන නැරඹීමට පැමිණි දේශීය විදේශීය සංචාරකයින්ගේ සංසන්දනාත්මක තොරතුරු**

## 2.2. 2013 වර්ෂයේ සිට 2017 වසර තෙක් උද්භිද උද්‍යාන වෙත පැමිණි සංචාරකයින්ගේ තොරතුරු

| විස්තරය | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | **2013** | **2014** | **2015** | **2016** | **2017** |
| දේශීය සංචාරකයින් සංඛ්‍යාව | 1,783,069 | 1,893,522 | 2,215,702 | 2,593,252 | 2,397,347 |
| විදේශීය සංචාරකයින් සංඛ්‍යාව | 293,454 | 345,468 | 407,553 | 465,405 | 440,207 |
| එකතුව | **2,076,523** | **2,238,990** | **2,623,255** | **3,058,657** | **2,837,554** |

## 2.3. 2017 දී උද්භිද උද්‍යාන වෙත පැමිණි සංචාරකයන්ගේ තොරතුරු

| සංචාරකයින් සංඛ්‍යාව | පේරාදෙණිය | හක්ගල | ගම්පහ | මිරිජ්ජවිල | සීතාවක | එකතුව |
|---|---|---|---|---|---|---|
| දේශීය වැඩිහිටි | 823,715 | 578,629 | 172,642 | 41,544 | 163,460 | 1,779,990 |
| දේශීය ළමුන් | 276,517 | 221,274 | 19,556 | 29,363 | 32,610 | 579,320 |
| ජ්‍යෙෂ්ඨ පුරවැසි | 12,264 | 16,898 | 736 | 2,796 | 5,343 | 38,037 |
| මුළු දේශීය සංචාරකයින් සංඛ්‍යාව | 1,112,496 | 816,801 | 192,934 | 73,703 | 201,413 | 2,397,347 |
| විදේශීය වැඩිහිටි | 386,141 | 16,898 | 315 | 138 | 184 | 403,676 |
| විදේශීය ළමුන් | 19,958 | 23,814 | 12 | 9 | 5 | 43,798 |
| විදේශීය සිසුන් | 6,561 | 1,860 | 6 | 6 | 14 | 8,447 |
| මුළු විදේශීය සංචාරකයින් සංඛ්‍යාව | 412,660 | 26,858 | 333 | 153 | 203 | 440,207 |
| මුළු එකතුව | 1,525,156 | 843,659 | 193,267 | 73,856 | 201,616 | 2,837,554 |


# 3. ආදායම

2017 වර්ෂයේ දී ඇතුල්වීමේ ගාස්තු, පැළ අලෙවිය යන ආදියෙන් උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව ලබාගත් සම්පූර්ණ ආදායම රුපියල් මිලියන 849කි (නරඹන්නන් ගෙන් රුපියල් මිලියන 753 ක් ද පැළ අලෙවියෙන් හා අනෙකුත් ක්‍රම හරහා රුපියල් මිලියන 96 ක් ද වශයෙනි). එය පසුගිය අවුරුද්දේ ඉහත කාල පරිච්ඡේදයට (රුපියල් මිලියන 784.4) සාපේක්ෂව 8% ක වැඩිවීමකි.

### 3.1. 2013 වර්ෂයේ සිට 2017 වසර දක්වා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට සංචාරකයන්ගේ පැමිණීමෙන් පමණක් ලැබුණු මුළු ආදායම

| විස්තරය | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
| දේශීය නරඹන්නන් ගෙන් ලැබුණු ආදායම (රු.මි) | 73 | 75.9 | 88.5 | 115.4 | 113 |
| විදේශීය නරඹන්නන් ගෙන් ලැබුණු ආදායම (රු.මි) | 314.9 | 369.8 | 435.1 | 594.3 | 640 |
| එකතුව (රු.මි) | **387.9** | **445.7** | **523.6** | **709.7** | **753** |

### 3.2. 2017 වර්ෂයේ උද්භිද උද්‍යානයන්/ඒකකයන් හි මාසික ආදායම් (රුපියල් මිලියන)




## 4. මූල්‍ය වියදම් ප්‍රගතිය

ප්‍රධාන උද්‍යානයන් හි සහ අනෙකුත් ඒකකවල සංවර්ධන කටයුතු සැලසුම් කළ පරිදි සිදු කළ අතර 2017 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ මූල්‍යමය ප්‍රගතිය 99% ක් විය.

### 4.1. 2017 වර්ෂයේ ප්‍රතිපාදන, වියදම, සහ ප්‍රගතිය

| විස්තරය | මුළු ප්‍රතිපාදන (රු.මි) | මුළු වියදම (රු.) | ප්‍රතිශතය |
|---|---|---|---|
| ප්‍රාග්ධන මූල්‍ය ප්‍රතිපාදන | 300.05 | 297.36 | 99.1 |
| පුනරාවර්තන මූල්‍ය ප්‍රතිපාදන | 364.69 | 358.28 | 98.2 |
| එකතුව | **664.74** | **655.64** | **98.6** |

## 4.2. 2017 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ ඒක් ඒක් ව්‍යාපෘති සඳහා වෙන්කළ මූලධන ප්‍රතිපාදන හා වියදම

| වැඩසටහන | 2017 දී වෙන් වූ රජයේ ඒකාබද්ධ ප්‍රතිපාදන(රු.මි) | 2017 දී ඒකාබද්ධ ප්‍රතිපාදන වියදම (රු.මි) | 2017 දී උද්භිද උද්‍යාන අරමුදලින් වෙන් වූ ප්‍රතිපාදන වියදම(රු.මි) | 2017 දී උද්භිද උද්‍යාන අරමුදලින් වියදම(රු.මි) | 2017 දී වෙන් වූ මුළු ප්‍රතිපාදන (රු.මි) | මුළු වියදම(රු.මි) | % |
|---|---|---|---|---|---|---|---|
| පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය සංවර්ධනය | 2.579 | 2.560 | 28.310 | 28.195 | 30.889 | 30.755 | 99.6 |
| ගම්පහ උද්භිද උද්‍යානය සංවර්ධනය | 16.55 | 15.334 | 17.250 | 17.232 | 33.80 | 32.566 | 96.3 |
| හක්ගල උද්භිද උද්‍යානය සංවර්ධනය | 3.941 | 3.929 | 35.911 | 35.890 | 39.852 | 39.819 | 99.9 |
| ගනේවත්ත වන ඖෂධ උද්‍යානය සංවර්ධනය | 9.25 | 9.236 | 0.710 | 0.707 | 9.960 | 9.943 | 99.8 |
| මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය | 6 | 5.982 | 0.0 | 0.0 | 6 | 5.982 | 99.7 |
| අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන | 0.5 | 0.496 | 2.250 | 2.247 | 2.750 | 2.743 | 99.7 |
| ශාකාගාරය සහ ශාක වර්ගීකරණ පර්යේෂණ වැඩසටහන | 0.0 | 0.0 | 4.850 | 4.841 | 4.850 | 4.841 | 99.8 |
| ජාතික මල්වගා සංවර්ධන වැඩසටහන | 10 | 9.985 | 24.626 | 24.612 | 34.626 | 34.597 | 99.9 |
| සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය සංවර්ධනය | 25.45 | 25.260 | 2.403 | 2.403 | 27.853 | 27.663 | 99.3 |
| මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය සංවර්ධනය | 74.2 | 73.205 | 0.0 | 0.0 | 74.20 | 73.205 | 98.7 |
| ප්‍රධාන කාර්යාලයේ වැඩිදියුණු කිරීම් කටයුතු සහ උද්භිද උද්‍යානයන් හි අලංකාරය හා ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම | 1.58 | 1.572 | 33.690 | 33.671 | 35.270 | 35.243 | 99.9 |
| **එකතුව** | **150.05** | **147.559** | **150.0** | **149.798** | **300.05** | **297.357** | **99.1** |

## 4.3. පුනරාවර්තන ප්‍රතිපාදන හා වියදම - 2017

| වැය විෂය | අයිතමය/ විස්තරය | 2017 ප්‍රතිපාදන (රු.) | 2017 ශුද්ධ වියදම (අධිභාර හර කිරීමෙන් පසු) (රු.) | ඉතිරි ප්‍රතිපාදන (රු.) | මුළු වියදම ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|
| | **පුද්ගල පඩිනඩි** | **300,500,000.00** | **294,284,298.37** | **6,215,701.63** | **97.9%** |
| 1001 | වැටුප් සහ වේතන | 162,200,000.00 | 160,227,973.78 | 1,972,026.22 | 98.8% |
| 1002 | අතිකාල සහ නිවාඩු දින වැටුප් | 8,300,000.00 | 8,295,440.12 | 4,559.88 | 99.9% |
| 1003 | වෙනත් දීමනා | 130,000,000.00 | 125,760,884.47 | 4,239,115.53 | 96.7% |
| | **ගමන් වියදම්** | **2,180,000.00** | **2,177,689.60** | **2,310.40** | **99.9%** |
| 1101 | දේශීය | 1,700,000.00 | 1,700,000.00 | - | 100.0% |
| 1102 | විදේශීය | 480,000.00 | 477,689.60 | 2,310.40 | 99.5% |
| | **සැපයීම්** | **11,773,000.00** | **11,751,528.58** | **21,471.42** | **99.8%** |
| 1201 | ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 1,100,000.00 | 1,098,845.43 | 1,154.57 | 99.9% |
| 1202 | ඉන්ධන | 5,673,000.00 | 5,652,714.50 | 20,285.50 | 99.6% |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 500,000.00 | 499,994.26 | 5.74 | 100.0% |
| 1205 | වෙනත් | 4,500,000.00 | 4,499,974.39 | 25.61 | 100.0% |
| | **නඩත්තු වියදම්** | **3,150,000.00** | **3,128,783.54** | **21,216.46** | **99.3%** |
| 1301 | වාහන | 2,200,000.00 | 2,189,726.73 | 10,273.27 | 99.5% |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 600,000.00 | 589,061.19 | 10,938.81 | 98.2% |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 350,000.00 | 349,995.62 | 4.38 | 100.0% |
| | **සේවා** | **45,567,000.00** | **45,423,757.35** | **143,242.65** | **99.7%** |
| 1401 | ප්‍රවාහන | 1,550,000.00 | 1,548,804.00 | 1,196.00 | 99.9% |
| 1402 | තැපැල් සහ සන්නිවේදන | 2,820,000.00 | 2,819,923.35 | 76.65 | 100.0% |
| 1403 | විදුලිය සහ ජලය | 5,000,000.00 | 4,858,306.66 | 141,693.34 | 97.2% |
| 1404 | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 277,000.00 | 276,723.34 | 276.66 | 99.9% |
| 1405 | වෙනත් | 35,920,000.00 | 35,920,000.00 | - | 100.0% |
| | **මාරුකිරීම්** | **1,520,000.00** | **1,511,464.70** | **8,535.30** | **99.4%** |
| 1506 | දේපළ ණය පොළී | 1,520,000.00 | 1,511,464.70 | 8,535.30 | 99.4% |
| **එකතුව** | | **364,690,000.00** | **358,277,522.14** | **6,412,477.86** | **98.2%** |

## 4.4. මූලධන ප්‍රතිපාදන හා වියදම - 2017

| උප ව්‍යාපෘතිය | වැය විෂය | අයිතමය/ විස්තරය | 2017 ප්‍රතිපාදන (රු.) | 2017 ශුද්ධ වියදම (අධිභාර හර කිරීමෙන් පසු) (රු.) | ඉතිරි ප්‍රතිපාදන (රු. ) | මුළු වියදම ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම** | **4,100,000.00** | **4,072,715.66** | **27,284.34** | **99.3%** |
| 0 | 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 3,000,000.00 | 2,986,456.23 | 13,543.77 | 99.5% |
| 0 | 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 600,000.00 | 596,037.38 | 3,962.62 | 99.3% |
| 0 | 2003 | වාහන | 500,000.00 | 490,222.05 | 9,777.95 | 98.0% |
| | | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | **4,000,000.00** | **3,988,673.85** | **11,326.15** | **99.7%** |
| 0 | 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 800,000.00 | 795,420.00 | 4,580.00 | 99.4% |
| 0 | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000.00 | 493,258.39 | 6,741.61 | 98.7% |
| 0 | 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2,700,000.00 | 2,699,995.46 | 4.54 | 100.0% |
| 0 | 2201 | ප්‍රාග්ධන මාරුකිරීම් රාජ්‍ය ආයතන (භාර අරමුදල) | 150,000,000.00 | 149,797,566.10 | 202,433.90 | 99.9% |
| 0 | 2401 | හැකියා වර්ධනය හා කාර්ය මණ්ඩල පුහුණු | 500,000.00 | 495,900.00 | 4,100.00 | 99.2% |
| | | **විශේෂ ව්‍යාපෘති** | | | | |
| | | **ගම්පහ උද්භිද උද්‍යානය හා ගනේවත්ත ඖෂධ උද්‍යානය සංවර්ධන වැඩසටහන** | **25,800,000.00** | **24,569,671.49** | **1,230,328.51** | **3.88** |
| 1 | 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 1,000,000.00 | 982,099.68 | 17,900.32 | 98.2% |
| 1 | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,600,000.00 | 1,596,162.95 | 3,837.05 | 99.8% |
| 1 | 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 12,400,000.00 | 11,193,181.95 | 1,206,818.05 | 90.3% |
| 1 | 2105 | ඉඩම් සහ ඉඩම් වැඩි දියුණු කිරීම | 10,800,000.00 | 10,798,226.91 | 1,773.09 | 100.0% |

| උප ව්‍යාපෘතිය | වැය විෂය | අයිතමය/ විස්තරය | 2017 ප්‍රතිපාදන (රු.) | 2017 ශුද්ධ වියදම (අධිභාර හර කිරීමෙන් පසු) (රු.) | ඉතිරි ප්‍රතිපාදන (රු. ) | මුළු වියදම ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| **2** | **2105** | මල්වගා සංවර්ධන වැඩසටහන | **10,000,000.00** | **9,984,784.83** | **15,215.17** | **99.8%** |
| | | **වියළි කලාපීය උද්භිද උද්‍යානය, හම්බන්තොට** | **74,200,000.00** | **73,205,401.71** | **994,598.29** | **98.7%** |
| 3 | 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 200,000.00 | 158,267.25 | 41,732.75 | 79.1% |
| 3 | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,000,000.00 | 967,214.10 | 32,785.90 | 96.7% |
| 3 | 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 44,000,000.00 | 43,095,051.73 | 904,948.27 | 97.9% |
| 3 | 2105 | ඉඩම් සහ ඉඩම් වැඩි දියුණු කිරීම | 29,000,000.00 | 28,984,868.63 | 15,131.37 | 99.9% |
| | | **තෙත් කලාපීය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල** | 25,450,000.00 | 25,259,850.54 | 190,149.46 | 3.92 |
| 4 | 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 1,300,000.00 | 1,294,830.84 | 5,169.16 | 99.6% |
| 4 | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,300,000.00 | 1,230,023.75 | 69,976.25 | 94.6% |
| 4 | 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 5,000,000.00 | 4,887,601.23 | 112,398.77 | 97.8% |
| 4 | 2105 | ඉඩම් සහ ඉඩම් වැඩි දියුණු කිරීම | 17,850,000.00 | 17,847,394.72 | 2,605.28 | 100.0% |
| 7 | 2105 | මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය | **6,000,000.00** | **5,981,508.35** | **18,491.65** | **99.7%** |
| එකතුව | | | **300,050,000.00** | **297,356,072.53** | **2,693,927.47** | **99.1%** |

# 5. 2017 වර්ෂයේ උද්භිද උද්‍යානයන් හි සිදු වූ සංවර්ධන වැඩසටහන්

සියලු ම උද්‍යානයන්හි භූමි අලංකරණ කටයුතු නිසි පරිදි සිදුකිරීම තුළින් ද නව සංවර්ධිත ප්‍රදේශ, අධිපාරවල්, වීදි, උද්‍යානයේ විවිධ අංශ කාර්යක්ෂම ව නඩත්තු කිරීම තුළින් ද උද්‍යානයන් හි අලංකරණය හා තත්ත්වය උසස් මට්ටමකින් පවත්වාගෙන යන ලදී.

## 5.1. රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය

| | |
|---|---|
| අනුමත ප්‍රතිපාදන :- | ඒකාබද්ධ අරමුදල - රු. මි. 2.529 * |
| | උද්‍යාන භාරකාර අරමුදල - රු.මි. 28.310* |
| 2017 වර්ෂයේ වියදම | :- රු.මි. 30.775 |


*අනුමත ප්‍රතිපාදන සංශෝධනය වී ඇත.

- වැඩ අවසන් කරන ලද ශාක සංරක්ෂණාගාරයේ අභ්‍යන්තර සැලසුම් නිර්මාණ කටයුතු සහ පැළෑටි ස්ථාපිත කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින අතර 2018 වර්ෂයේ අප්‍රේල් මස මහජනතාවට විවෘත කිරීමට බලාපොරොත්තු වේ.




**අභ්‍යන්තර නිර්මාණ කටයුතු සිදුකරමින් පවතින ශාක සංරක්ෂණාගාරය**

- උද්‍යානයේ අභ්‍යන්තර මාර්ග පද්ධති, බෝක්කු හා ජලාපවහන පද්ධති වැඩි දියුණු කිරීම් කටයුතු සිදුකරන ලද අතර ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම මඟින් උද්‍යානයට නව පෙනුමක් ද ලබා දීමට කටයුතු කරන ලදී.
- උද්‍යානයේ ප්‍රධාන මාර්ගවල තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා කාපට් ඇතිරීම සිදු කරන ලදී.




**උද්‍යානයේ මාර්ග සංවර්ධන කටයුතු**

- උද්‍යානයේ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමේ කටයුතු සිදුකරමින් පවතින අතර එයට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම්, ආකෘති ස්ථාපිත කිරීම් කටයුතු සිදු කරන ලදී.
- අලුතින් නිල නිවාසයක ඉදිකිරීම් කටයුතු නිමකරන ලද අතර උද්‍යානයේ අනෙකුත් නිලධාරී නිල නිවාස ද අලුත්වැඩියා කරන ලදී.



**කසළ කළමනාකරණය සඳහා උද්‍යානය තුළ ස්ථාපිත කසළ බඳුන්**

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව ශක්තිමත් කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 142,127 පැළ ප්‍රමාණයක් නිපදවන ලදී.
- උද්‍යානයේ ශාක එකතුවට අදාල ශාක නාම පුවරු සවි කිරීම සිදුකරන ලද අතර විශේෂ ශාක පිළිබඳ සවිස්තරාත්මක පුවරු, උද්‍යානය තුළ මාර්ග සංඥා පුවරු සහ සිහිවටන ශාක එකතුවේ ශාක නාම පුවරු ස්ථාපිත කිරීමද සිදු කරන ලදී.



**උද්‍යානය තුළ සවි කරන ලද මාර්ග සංඥා පුවරු**

- වනඋද්‍යානයේ ශාක අංශ 4 ක (O,P,H සහ B) ප්‍රතිශෝධන කටයුතු සිදුකරමින් පවතී. කුරුල්ලන් සහ සමනලුන් වඩා ආකර්ෂණය වන ශාක එකතුන් උද්‍යානයේ ස්ථාපිත කිරීමට ද කටයුතු සිදුකරන ලදී.
- නරඹන්නන් සඳහා අවශ්‍ය තොරතුරු ලබාදිය හැකි තොරතුරු ඇතුළත් පත්‍රිකා, පුවරු සකස් කරමින් පවතී. පැමිණෙන නරඹන්නන් හට උද්‍යානය පිළිබඳ තොරතුරු ලබා දීමට උද්‍යානය තුළ සංචාරය සඳහා මඟපෙන්වීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ අතර වැඩසටහන් 40 ක් පවත්වා නරඹන්නන් 1733 දෙනෙකු සඳහා එම සේවාව සපයා ඇත.

## 5.2. හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය, ගම්පහ

| | |
|---|---|
| අනුමත ප්‍රතිපාදන: ඒකාබද්ධ අරමුදල - රු. මි. 16.55 | |
| උද්භිද උද්‍යාන භාරකාර අරමුදල- රු.මි. 17.25* | |
| 2017 වර්ෂයේ වියදම | : රු.මි. 32.566 |

*අනුමත ප්‍රතිපාදන සංශෝධනය වී ඇත.

- උද්‍යානයේ බාහිර පෙනුම වර්ධනය කිරීමේ අරමුණින් උද්‍යානයේ පිහිටි ගොඩනැගිලි, නිල නිවාස, පැළ ගෘහ, උද්‍යානය වටා තාප්පය, ගිම්හාන කුටි සහ සෙවන ගෘහයෙහි අලුත්වැඩියා කටයුතු සිදුකරන ලද අතර උද්‍යානයේ තත්ත්වය ඉහළ මට්ටමකට නඟා සිටුවීම සඳහා භූමි සංවර්ධන හා වැඩි දියුණු කිරීම් කටයුතු සහ සෙසු නඩත්තු කටයුතු ද සිදු කරන ලදී.



ඉදිවෙමින් පවතින ඕකිඩ් ගෘහය

- උද්‍යානයට අවශ්‍ය නව ගරාජයක ඉදිකිරීම් කටයුතු සිදු කරන ලදී.
- උද්‍යානයේ රසායනාගාරය ඉදිරිපිට වටරවුම් පාර පිළිසකර කර නිම කරන ලදී.
- උද්‍යානයේ ප්‍රධාන නිල නිවස අලුත්වැඩියා කරන ලද අතර ආරක්ෂිත බැම්මෙහි කොටසක් පිළිසකර කරන ලදී.
- නරඹන්නන් ගේ භාවිතය සඳහා නව වැසිකිළි පද්ධතියක ඉදිකිරීම් කටයුතු නිම කරන ලදී.
- උද්‍යානයේ සේවක පහසුකම් ඉහළ නැංවීම සඳහා අවශ්‍ය දෙමහල් ගොඩනැගිල්ලක පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු නිම කරන



ප්‍රතිසංස්කරණය කරන ලද ආරක්ෂිත තාප්පය

ලදී. මෙහිදී සේවකයින් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම හා යන්ත්‍රසූත්‍ර ගබඩා කිරීම සඳහා භාවිතා කිරීමට බලාපොරොත්තු වේ.



උද්‍යානයේ ස්ථාපිත කරන ලද මල් ආකෘති

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව ශක්තිමත් කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 56,875 පැළ ප්‍රමාණයක් නිපදවන ලදී. උද්‍යානයේ ශාක එකතුවට අදාළ ශාක නාම පුවරු ද සවි කිරීම සිදුකරන ලදී.

- නරඹන්නන් සඳහා අවශ්‍ය තොරතුරු ලබාදිය හැකි තොරතුරු ඇතුළත් පත්‍රිකා, පුවරු සකස් කරන ලදී.

- උද්‍යානය වෙත නරඹන්නන් පැමිණෙන ප්‍රමාණය වර්ධනය කිරීමේ අරමුණින් මහජන ප්‍රදර්ශනය සඳහා ඕකිඩ් ශාක ගෘහයක ඉදිකිරීම් කටයුතු සිදුකරන ලද අතර 90% ක වැඩ දැනට අවසන් වී ඇත. මේ සඳහා උපදේශන සේවා සහ ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලබන්නේ ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාවයි. මීට අමතරව බොන්සායි ශාක එකතුවක් ද මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කිරීමට කටයුතු කරන ලදී.

- උද්‍යානය පිහිටි ඉඩම අසලින් ගලා යන අත්තනගලු ඔයේ ඉවුරු ඛාදනය අධික බැවින් උද්‍යානය පිහිටි ඉඩම ඔයට සේදීයාමේ තර්ජනයට ලක්ව ඇත. ඉවුරු ඛාදනය අවම කිරීම සඳහා ඉවුරෙ හි සංරක්ෂණ කටයුතු සිදුකරමින් පවතී.


- උද්‍යාන අලංකරණය වැඩිදියුණු කිරීම සඳහා බඳුන්ගත මල් පැළ විවිධ ආකෘතිවලට ඇතුළත් කර මහජන ප්‍රදර්ශනය සඳහා වසර පුරාම පවත්වාගෙන යන පරිදි සිදු කිරීමට කටයුතු ආරම්භ කරන ලදී. මේ සඳහා අවශ්‍ය මල් පැළ හා ආකෘති සකස් කර මහජන ප්‍රදර්ශනය සඳහා තබා ඇත.

## 5.3. හක්ගල උද්භිද උද්‍යානය


| | |
|---|---|
| අනුමත ප්‍රතිපාදන: ඒකාබද්ධ අරමුදල - රු. මි. 3.941 | |
| උද්භිද උද්‍යාන භාරකාර අරමුදල - රු.මි.35.911* | |
| 2017 වර්ෂයේ වියදම | : රු.මි. 39.819 |

*අනුමත ප්‍රතිපාදන සංශෝධනය වී ඇත.

- උද්‍යානයේ බාහිර පෙනුම වර්ධනය කිරීමේ අරමුණින් උද්‍යානයේ පිහිටි ගොඩනැගිලි, නිල නිවාස, පැළ ගෘහ, ගිම්හාන කුටි, සංචාරක බංගලාවෙහි හා වෙනත් ආකෘතිවල තීන්ත ආලේප කර අලුත්වැඩියා කටයුතු සිදුකරන ලදී.
- කාර්ය මණ්ඩල නිල නිවාසවලට අමතරව අලුතින් නිල නිවාස 4 ක් සහිත නිවාස සංකීර්ණයක පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු නිමකරන ලදී.
- නව වැසිකිළි පද්ධතියක ඉදිකිරීම් කටයුතු නිමකරන ලද අතර උද්‍යානයේ වැසිකිළි පද්ධතීන් හි නඩත්තු කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විශේෂඥ කණ්ඩායමකගේ උපදෙස් ද ඇතිව පල්දොරු වලවල් 02 ක් අලුතින් ස්ථාපනය කරන ලදී.
- උද්‍යානය වටා ආරක්ෂිත වැටෙහි කොටසක් ස්ථාපිත කිරීම සිදු කරන ලදී.



සංවර්ධන කටයුතු සිදු කරන ලද උද්‍යානයේ නව පිවිසුම් මාර්ගය



ඉදිකෙරුණු කසළ කළමනාකරණ මධ්‍යස්ථානය

- උද්‍යාන අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාවලිය සවිමත් කිරීම සඳහා අවශ්‍ය මධ්‍යස්ථානයක්, බැහැර කරන කසළ එකතු කිරීමට, වෙන් කිරීමට හා ගබඩා කිරීමට ඉදිකරන ලදී.



**උද්‍යානයේ සිදුකරන ලද භූමි සංවර්ධන කටයුතු**

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව ශක්තිමත් කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 128,789 පැළ ප්‍රමාණයක් නිපදවන ලදී. අවශ්‍ය ශාක නාම පුවරු ද සවි කරන ලදී.

- නරඹන්නන් සඳහා අවශ්‍ය තොරතුරු ලබාදිය හැකි තොරතුරු ඇතුළත් පත්‍රිකා, පුවරු සකසා මුද්‍රණය වෙමින් පවතී.

- උද්‍යානයේ නව පිවිසුම් දොරටුව අසල රථගාලක් ඉදි කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. එහි පස සම්බන්ධ ව තාක්ෂණික ගැටළුවක් පැන නැඟීම හේතුවෙන් එය නවතා දැමීමට සිදු වූ අතර අවශ්‍ය තාක්ෂණික උපදෙස් රැගෙන නැවත ඊළඟ වර්ෂයේ දී ඉදිකිරීම් කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

- උද්‍යානයේ තත්ත්වය ඉහළ මට්ටමකට නඟා සිටුවීම සඳහා භූමි සංවර්ධන කටයුතු සහ සෙසු නඩත්තු කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

- උද්‍යානයේ මාර්ගවල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ගල් ඇතිරීමේ කටයුතු සිදුකරන ලද අතර නව පිවිසුම් මාර්ගයේ ඇතුල් කොටස සකස් කරන ලදී.

- උද්‍යානයේ නව ප්‍රවේශ පත්‍ර කවුළුවේ ආරක්ෂාව සඳහා චේන් ලින්ක් වැටක් ස්ථාපිත කරන ලදී.

## 5.4. ගනේවත්ත වන ඖෂධ උද්‍යානය සංවර්ධනය

| |
|---|
| අනුමත ප්‍රතිපාදන: ඒකාබද්ධ අරමුදල - රු. මි. 9.25<br>උද්භිද උද්‍යාන භාරකාර අරමුදල - රු.මි. 0.71 *<br><br>2017 වර්ෂයේ වියදම : රු.මි. 9.943 |

*අනුමත ප්‍රතිපාදන සංශෝධනය වී ඇත.

- උද්‍යානයේ බාහිර පෙනුම වැඩිදියුණු කිරීම සඳහා ගොඩනැගිලි සහ අනෙකුත් ව්‍යුහයන් හි නඩත්තු කටයුතු සිදුකිරීම තුළින් උද්‍යානය උසස් තත්ත්වයකින් පවත්වා ගැනීමට කටයුතු සිදුකරන ලදී.
- උද්‍යානයේ රෝපණ වැඩසටහන ක්‍රියාත්මක වූ අතර පැළ 27,318කට අධික ප්‍රමාණයක් නිපදවන ලදී. අධික නියං කාලයක් වර්ෂය මුල සිට මේ දක්වා පැවති හෙයින් ශාක එකතුන් අලුතින් ඇතිකිරීම අපහසු වූ නමුත් පවතින ශාක එකතුන් වැඩිදියුණු කිරීමට කටයුතු කරන ලදී.
- නරඹන්නන් සඳහා වන පහසුකම් ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පානීය ජල කරාම සහ බංකු ස්ථාපිත කරන ලදී.
- පැළ බඳුන් ගත කරන ස්ථාන දෙකක් ස්ථාපිත කිරීමට කටයුතු සිදුකරන ලදී.
- ශාකාගාර කොටසෙහි සිවිලිම අලුත්වැඩියා කරන ලද අතර පැළ ගෘහයේ නවීකරණ කටයුතු සිදු කරන ලදී.



**ජලජ ඖෂධීය පැළෑටි එකතුවක් ස්ථාපනය කිරීම සඳහා නිර්මාණය කරන ලද පොකුණ**



**අලුත්වැඩියා කෙරුණු පැළ ගෘහය**

- අලුතින් ඉදි කරන ලද දේශීය ඖෂධ අගයන්ගෙන් යුත් ආහාර පාන සහිත ආපන ශාලාව මහජනතාවට විවෘත කරන ලදී.



උද්‍යානයේ ස්ථාපිත බංකු

- ඖෂධ ශාක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ පුද්ගලයින් 2,416 දෙනෙකු ඖෂධ ශාක භාවිතය, ඒවායෙහි වටිනාකම සහ සංරක්ෂණය පිළිබඳ දේශන පවත්වා දැනුවත් කරන ලදී. නරඹන්නන් සඳහා ඖෂධ ශාක පිළිබඳ අවශ්‍ය තොරතුරු ලබාදිය හැකි තොරතුරු ඇතුළත් පත්‍රිකා 15ක් විස්තරාත්මක ශාක පුවරු 25ක් සඳහා අවශ්‍ය තොරතුරු රැස් කර ඒවා සකස් කර මුද්‍රණය කරන ලදී.



ඖෂධ ශාක පිළිබඳ දැනුවත් කිරීම් දේශන පවත්වමින්

- නියං කාලයේ දී ප්‍රයෝජනයට ගැනීම සඳහා වර්ෂා ජලය එක් රැස් කරන ස්ථානයක් ස්ථාපිත කරන ලදී.
- උද්‍යානයේ සේවකයින් සඳහා ක්ෂේත්‍ර කාර්යාලයක් ද ඉදිකරන ලදී.
- ජලජ ඖෂධ ශාක එකතුවක් ස්ථාපිත කිරීම සඳහා පොකුණක් ඉදිකරන ලද අතර ඉඩම් වැඩිදියුණු කිරීම් කටයුතු ද සිදුකරන ලදී.

## 5.5. ශාකාගාරය සහ ශාක වර්ගීකරණ පර්යේෂණ

| | |
|---|---|
| අනුමත ප්‍රතිපාදන: උද්භිද උද්‍යාන භාරකාර අරමුදල - | රු. මි. 4.85* |
| 2017 වර්ෂයේ වියදම | : රු.මි. 4.841 |

*අනුමත ප්‍රතිපාදන සංශෝධනය වී ඇත.

- ජෛව භූගෝල විද්‍යාව (Bio Geography) පිළිබඳ එක් දින වැඩමුළුවක් ජෛව විද්‍යා ආයතනය හා එක්ව රාජකීය උද්භිද උද්‍යාන අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථාන පරිශ්‍රයේ, ජාතික ශාකාගාරය මඟින් සංවිධානය කර පවත්වන ලදී. මෙහි දී ජෛව භූගෝල විද්‍යාව පිළිබඳ දේශන හා එයට අදාළ ප්‍රායෝගික විධි පිළිබඳ වැඩමුළුවට සහභාගිවූවන් දැනුවත් කරන ලදී. ප්‍රධාන වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රජාව සහ අනෙකුත් අදාළ අංශ මේ හරහා දැනුවත් කරන ලදී. මේ සඳහා ෆ්ලෝරිඩා විශ්වවිද්‍යාලයේ ජෛව විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රාණී විද්‍යාව (Natural History) පිළිබඳ කෞතුකාගාරයේ ආචාර්ය නිකෝ සෙලිනස් (Dr. Nico Cellines), දකුණු අප්‍රිකාවේ ක්වාසුලු-නටාල් විශ්වවිද්‍යාලයේ (Kwazulu-Natal University) ජ්‍යෙෂ්ඨ පර්යේෂකයෙකු වන ආචාර්ය




ජාතික ශාකාගාරය මඟින් සංවිධානය කර පවත්වන ලද ජෛව භූගෝල විද්‍යාව (Bio Geography) පිළිබඳ එක් දින වැඩමුළුවේ අවස්ථාවක්



ජාතික ශාකාගාරය මඟින් ජාතික රතු දත්ත නාමාවලි ග්‍රන්ථය සැකසීමේ ව්‍යාපෘතියේ රැස්වීම් අවස්ථාවක්

රොබට් ඩග්ලස් ස්ටෝන් (Dr. Robert Dauglas Stone) සහ ෆ්ලෝරිඩා විශ්වවිද්‍යාලයේ ජෛව විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රාණි විද්‍යාව පිළිබඳ කෞතුකාගාරයේ ප්‍රභා අමරසිංහ මිය සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

- ජෛව විවිධත්වය සංරක්ෂණය සහ ශාකාගාර තාක්ෂණික ක්‍රම හා කළමනාකරණය පිළිබඳ වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 18 ක් පාසල් සිසුන් 318ක්, විශ්වවිද්‍යාල සිසුන් 448 ක් ද, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ නිලධාරීන් 143 ක් සඳහා පවත්වන ලදී. මෙහි දී ජෛව විවිධත්වය යනු කුමක්ද යන්න සහ ජෛව විවිධත්ව සංරක්ෂණයෙහි වැදගත්කම සහ ශාකාගාරයෙහි දායකත්වය පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කෙරිණි. මීට අමතරව ෆ්ලොරිඩා විශ්වවිද්‍යාලීය සිසුන් 25 දෙනෙකුට ශාකගාරයේ ඉතිහාසය හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ දේශනයක් ද පවත්වන ලදී.



**ජෛව විවිධත්වය සංරක්ෂණය පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කළ අවස්ථාවක්**

- උද්භිද විද්‍යාත්මක ශාක ගවේෂණ වැඩසටහන යටතේ ප්‍රධාන වශයෙන් වියළි සහ තෙත් කලාපීය තර්ජනයට ලක් වූ ශාක ඉලක්ක කරගනිමින් ශාක ගවේෂණ කටයුතු මෙම වසරේ දී ද සිදු කරන ලදී. උද්භිද විද්‍යාත්මක ශාක ගවේෂණ වැඩසටහන යටතේ ක්ෂේත්‍ර ගවේෂණ 24ක් සිදු කරන ලද අතර සජීවී සපුෂ්ප ශාක නිදර්ශක 1,185ක්, මීවන ශාක නිදර්ශක 106ක් සහ පාසි ශාක නිදර්ශක 47ක් එකතු කෙරිණි. මෙම ශාක නිදර්ශක අතුරින් තර්ජනයට ලක් වූ ශාක හඳුනාගැනීම සිදුකළ අතර, වඳ වී ගිය ශාක කාණ්ඩයේ එක් ශාක විශේෂයක් ද, දැඩි ලෙස වඳ වී යාමේ



**උද්භිද විද්‍යාත්මක ශාක ගවේෂණ වැඩසටහන යටතේ ක්ෂේත්‍ර ගවේෂණ සිදු කිරීමේ දී රුමස්සල ක්ෂේත්‍ර ගවේෂණයේදී සොයා ගත් වඳ වී ගොස් ඇති බවට 2012 රතු දත්ත පොතෙහි සඳහන් *Rinorea bengalensis* ශාකය**

අවදානමට ලක්වූ ශාක 10ක් ද, වඳ වී යාමේ අවදානමට ලක්වූ ශාක 80ක් ද, අනාගතයේ දී අවදානමට ලක්විය හැකි ශාක 129ක් ද, තර්ජනයට ලක්වීමට ආසන්න ශාක 79ක් ද හඳුනා ගන්නා ලදී. ශාක විතැන් සංරක්ෂණ ක්‍රමවේද යොදා ගනිමින් අවශ්‍ය අවස්ථාවල දී ශාක සංරක්ෂණ කටයුතු ද සිදු කරන ලද අතර රැස් කර ගන්නා ලද නිදර්ශක ජාතික ශාකාගාරයේ අනාගත විමර්ශනය සඳහා තැන්පත් කිරීමට කටයුතු කර ඇත.

- මෙම උද්භිද විද්‍යාත්මක ශාක ගවේෂණ වැඩසටහන යටතේ ක්ෂේත්‍ර ගවේෂණ සිදු කිරීමේ දී රුමස්සල ක්ෂේත්‍ර ගවේෂණයේ දී සොයාගත් වඳ වී ගොස් ඇති 2012 රතු දත්ත පොතෙහි සඳහන් *Rinorea bengalensis* ශාකය සොයා ගැනින. උද්භිද විද්‍යාත්මක ශාක ගවේශණ වැඩසටහනට අමතරව දුර්ලභ ඖෂධීය පැළෑටි ගවේෂණය සඳහා ද වැඩසටහනක් පේරාදෙණිය උද්භිද උද්‍යානය සමඟ එක්ව ආරම්භ කරන ලදී. මෙහි දී සිදුකරන ලද ක්ෂේත්‍ර ගවේෂණවල දී දුර්ලභ ඖෂධීය පැළෑටි විශේෂ 42ක් එකතු කරන ලද අතර සංරක්ෂණ කටයුතු සඳහා ගනේවත්ත වන ඖෂධ උද්‍යානයට භාර දෙන ලදී. මෙම වැඩසටහන මඟින් ගනේවත්ත පිහිටි වන ඖෂධ උද්‍යානය පැළෑටි එකතුව වැඩිදියුණු කිරීම ද අරමුණු වේ.

- පාසි සංරක්ෂණ වැඩසටහනක් ද ශාකාගාරය මඟින් සිදුකරන ලද අතර ක්ෂේත්‍ර ගවේෂණවල දී එකතු කරගන්නා පාසි ශාක විශේෂ එකතුවක් රාජකීය උද්භිද උද්‍යානය තුළ ස්ථාපිත කර පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී.

- ජාතික ශාකාගාරය මඟින් ජාතික රතු දත්ත නාමාවලි ග්‍රන්ථය සැකසීමේ ව්‍යාපෘතිය සඳහා මහඟු දායකත්වයක් සපයන ලදී. මෙහි දී ශාක නිදර්ශක ඇගයීම්,තොරතුරු එක් රැස්කිරීම හා ශාක නාම තහවුරු කිරීම් කටයුතු සිදුකරන ලදී. මීට අමතරව බාහිර පුද්ගලයන් සඳහා ශාකවල උද්භිද විද්‍යාත්මක නාම තහවුරු කිරීම,ශාක හඳුනාගැනීම් කටයුතු සිදුකරන ලද අතර ශ්‍රී ලංකා පොලීසිය,උසාවි හා අනෙකුත් අවශ්‍ය ආයතන සඳහා මෙම සේවාවන් සපයන ලදී.

- "Common Wayside Trees of Sri Lanka" යන ග්‍රන්ථ සංග්‍රහයෙ හි සංස්කරණ කටයුතු අවසන් කර මුද්‍රණය කර ප්‍රකාශයට පත් කරන ලදී. එහි ඡායාරූප සහිත නිදර්ශක 200ක් ද විද්‍යාත්මක තොරතුරු/ පොදු නාම, සංරක්ෂණ තත්ත්වයන්, වාසස්ථාන ද අඩංගු ය. මෙම ග්‍රන්ථ තොරතුරු දෙමළ සහ සිංහල භාෂාවන්ගෙන් යුක්ත වේ.

- ශ්‍රී ලංකාවේ තර්ජනයට ලක් වූ ශාක, ආක්‍රමණික ශාක, පර්ණාංග සහ ක්ෂේත්‍ර ගවේෂණ හරහා එකතු කර ගන්නා ලද තර්ජනයට ලක් වූ ශාක පිළිබඳ අත් පත්‍රිකා, පෝස්ටර් මුද්‍රණය සඳහා සකස් කර නිම කරන ලදී. මීට අමතරව ඓතිහාසික,ලෝක ප්‍රසිද්ධියට පත් හරමානිස් ඩී. අල්විස් ශාක රූපසටහන්(චිත්‍ර) එකතුව ප්‍රකාශනය සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින අතර ලබන වසර

මුල ප්‍රකාශයට පත්කිරීමට කටයුතු යොදා ඇත.මෙහි අලංකාර ශාක රූප සටහන් 184ක් ශාක පිළිබඳ උද්භිද විද්‍යාත්මක විස්තර සමඟ ඇතුළත් වී ඇත.

- මධ්‍යම පළාත තුළ තෝරාගත් ප්‍රදේශවල පාසි ශාකවල විවිධත්වය පිළිබිඹු කෙරෙනා විද්‍යාත්මක පෝස්ටර් පත්‍රිකාවක් නිර්මාණයකර එය ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක(27 වැනි ආසියා පැසිපික් වනාන්තර විද්‍යා කොමිසම) ප්‍රදර්ශනය කරන ලදී.
- ජාතික ශාකාගාරයේ තැන්පත් රූප සටහන් සහ නිදර්ශක සංඛ්‍යාව නිර්ණයට සහ අධ්‍යයනය පහසු කිරීමේ අරමුණින් එම නිදර්ශකවලට ප්‍රවේශ අංකයන් (Accession number) ලබා දී ඒවා දත්ත පද්ධතියකට ඇතුළත් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.
- ජාතික ශාකාගාරයේ වහලයෙහි අලුත්වැඩියා කටයුතු සිදුකළ අතර ජාතික ශාකාගාරය තුළ තැන්පත්කර ඇති නිදර්ශක නිසියාකාරව නඩත්තු කර පවත්වාගෙන යාමට ද කටයුතු සිදු කරන ලදී.

## 5.6. ජාතික මල්වගා සංවර්ධන වැඩසටහන

| | |
|---|---|
| අනුමත ප්‍රතිපාදන: ඒකාබද්ධ අරමුදල - | රු. මි. 10 |
| උද්භිද උද්‍යාන භාරකාර අරමුදල | රු. මි. 24.626 * |
| 2017 වර්ෂයේ වියදම | : රු.මි. 34.597 |

*අනුමත ප්‍රතිපාදන සංශෝධනය වී ඇත.

කුඩා සහ මධ්‍ය ප්‍රමාණයේ මල්වගාකරුවන් සවිබල ගැන්වීම සහ ඔවුන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීමට මල්වගා සංවර්ධන වැඩසටහන මෙම වසරේදී ද ක්‍රියාත්මක කරන ලදී.



වගාකරුවන් දැනුවත් කරමින්

- දිවයින පුරා මල්වගා ව්‍යාප්තිය සඳහා මල්වගා ගොවි සංගම් ප්‍රමාණය 185ක් ක්‍රියාත්මකවන අතර ඒ හරහා සාමාජිකයින් 7,000ක් පමණ ප්‍රතිලාභ ලබයි. ඇන්තූරියම්, ඕකිඩ්, රෝස, ජර්බෙරා, කැපූ පත්‍ර සහ පටක රෝපණය පිළිබඳ පුද්ගලයින් 21,724 ක් පුහුණු කර ඇත.

- මල්වගාකරුවන්ගේ තාක්ෂණික සහ සෙසු නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා වැඩමුළු 14 ක් පවත්වන ලද අතර වගා කරුවන් 1,059 ක් දෙනෙකු පුහුණු කරන ලදී.



අලුත්වැඩියා කළ බිගෝනියා පැළ ගෘහය

- මල්වගාකරුවන්ගේ නිෂ්පාදන අලෙවිකරණය ඉහළ නැංවීම සඳහා සුළු පරිමාණ ප්‍රදර්ශන 322 ක් සහ දිස්ත්‍රික් මට්ටමේ විශාල ප්‍රදර්ශන 20 ක් පවත්වන ලදී. මල්වගා කරුවන්ගේ පැළ තවාන් 1,514 කට ගොස් ඔවුන්ගේ ක්ෂේත්‍ර ගැටළු සඳහා උපදෙස් ලබාදෙන ලදී.

- ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව සමඟ සහයෝගීත්වයෙන් 2017 වසරේ ඔක්තෝබර් 30 වැනි දින මල් වගා පර්යේෂණ පිළිබඳ ජාතික සමුළුව පවත්වන ලදී. මෙහි දී මල්වගා ක්ෂේත්‍රයේ පවතින ගැටළු පිළිබඳ, සංවර්ධනය උදෙසා වන පර්යේෂණ පත්‍රිකා 22ක් ඉදිරිපත් කරන ලදී.



මල්වගා ප්‍රදර්ශනයක් පවත්වමින්

- රටෙහි මල්වගා කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා වර්තමාන හා අනාගත ක්ෂේත්‍ර අවශ්‍යතාවයන්ට සරිලන පර්යේෂණ කටයුතු සිදුකරන ලද අතර වර්තමානයේ වගාකරුවන් මුහුණ දෙන ගැටළු විසඳීම සඳහා පර්යේෂණ කිහිපයක් ද ක්‍රියාත්මක කරන ලදී. මීට අමතර ව වාණිජමය මල්වගාව, තවාන් පාලනය, පලිබෝධ සහ රෝග පාලනය ආශ්‍රිතව පැන නඟින ගැටළු සම්බන්ධව පුද්ගලයින් සහ ආයතන සඳහා ගාස්තු අය කිරීමකින් තොරව උපදේශන කටයුතු සිදු කරන ලදී.

- ක්ෂේත්‍රයේ දී සහ රසායනාගාර පහසුකම් යටතේ ඕකිඩ් දෙමුහුන් වර්ග සහ ඇන්තූරියම් වර්ග සැකසීම සඳහා පර්යේෂණ හා පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී.

- සියලු ම උද්‍යානයන් හි මල්වගා අංශ වල පැළ තවාන් උසස් මට්ටමකින් නඩත්තු කළ අතර වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය සඳහා අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය මිල දී ගැනීම් සිදු කරන ලදී. පේරාදෙණිය උද්‍යානයෙහි බිගෝනියා පැළ ගෘහයෙහි තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් අලුත්වැඩියා කටයුතු සිදු කරන ලදී. පේරාදෙණිය මල්වගා අංශයෙහි විද්‍යාගාරය ද අලුත්වැඩියා කරන ලදී.



වගාකරුවන් දිරිමත් කිරීමේ අරමුණින් රෝපණ ද්‍රව්‍ය ලබා දෙමින්

- මල්වගා ක්ෂේත්‍රය හා ශාක සම්බන්ධ තොරතුරු කොළඹ ප්‍රදේශයේ ජනතාවට ලබාදීම සඳහා තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස වැඩිදියුණු කරන ලද නාරාහේන්පිට සහකාර අධ්‍යක්ෂ කාර්යාලයෙහි පිහිටි ශ්‍රවණාගාරයේ දී මල්වගා ක්ෂේත්‍රය, ශාක සම්බන්ධ උපදේශන කටයුතු සිදුකිරීම, පුහුණු පන්ති පැවැත්වීම වැනි මල්වගා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට සහ සංවර්ධනයට අදාල කටයුතු සිදු කරන ලදී. මෙහිදී පුද්ගලයන් 488 කට අවශ්‍ය පුහුණුව හා දැනුම ලබා දෙන ලදී.

- මල්වගා ක්ෂේත්‍රයේ නියැලෙන මල්වගා ගොවි සංගම්වල සාමාජිකයින් හට පහසුකම් සැලසීමේ අරමුණින් සෙවන දැල්, පොලිතින් හා ප්ලාස්ටික් පෝච්චි මිලදීගෙන ඔවුන් අතර බෙදාදීමට කටයුතු කරන ලදී.

- රටෙහි මල්වගා කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා වර්තමාන හා අනාගත ක්ෂේත්‍ර අවශ්‍යතාවයන්ට සරිලන පර්යේෂණ කටයුතු සිදුකරන ලද අතර වර්තමානයේ වගාකරුවන් මුහුණ දෙන ගැටළු විසඳීම සඳහා පර්යේෂණ කිහිපයක් ද ක්‍රියාත්මක කරන ලදී.

### 5.6.1. 2017 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ

1. මාස 4 - 8 වයසැති මධ්‍යම ප්‍රමාණයේ ඩෙන්ඩ්‍රෝබියම් ඕකිඩ් වර්ධක වර්ධනය සඳහා පොහොර අනුපාත හා හෝමෝන බලපෑම අධ්‍යනය කිරීම.

2. ඇන්තූරියම් "Avo Red" ප්‍රභේදයේ පුෂ්ප හටගැනීම වැඩිදුයුණු කිරීම සඳහා පොහොර අනුපාත හා යොදන ක්‍රමයෙහි බලපෑම සෙවීම.

3. ඇන්තූරියම් හා අග්ලොනීමා ශාකවල වර්ධනය හා විකසනය සඳහා ක්ෂුද්‍ර මූලද්‍රව්‍යවල බලපෑම සෙවීම.

4. අග්‍රස්ථය ඉවත් කරන ලද *Dracaena reflexa* ශාකවල අංකුර ගුණනය හා දිගුවීම සඳහා හෝමෝනවල බලපෑම සෙවීම.

5. ඔන්සීඩියම් ඕකිඩ් පුෂ්ප මංජරිය මඟින් පටක රෝපණය කිරීම.

6. පිච්ච හා අරලිය මල්, දිගු දුර ප්‍රවාහනය සඳහා ක්‍රමවේද සොයා බැලීම.

7. "Pot puree" සඳහා සුගන්ධවත් පුෂ්ප වියළීමේ ක්‍රමවේද සොයා ගැනීම.

## 5.7. අධ්‍යාපනය සහ පුහුණුව

| | | |
|---|---|---|
| අනුමත ප්‍රතිපාදන: ඒකාබද්ධ අරමුදල - | රු. මි. 0.5 ක් | |
| | උද්භිද උද්‍යාන භාරකාර අරමුදල - | රු.මි. 2.25 * |
| 2017 වර්ෂයේ වියදම | :- රු.මි. 2.743 | |

*අනුමත ප්‍රතිපාදන සංශෝධනය වී ඇත.

පේරාදෙණිය උද්භිද උද්‍යානයේ පිහිටි අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානයේ පහසුකම් වැඩි දියුණු කරන ලද අතර අලුත්වැඩියා කටයුතු සිදු කරන ලදී.



එක් දින ඕකිඩ් වගාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වමින්

- තරුණයින් 120 දෙනෙකු නවීන මල් වගා ක්‍රමවේද, භූ අලංකරණ ක්‍රමවේද පිළිබඳව ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව හරහා පුහුණු කරන ලදී.
- භූදර්ශන සංවර්ධන සහකාර ලෙස ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය - මට්ටම 4 (NVQ- level 4) ලබා දෙන එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම් සිදුකරන ලද අතර 7 දෙනෙකු ලියාපදිංචි වී පාඨමාලාව හදාරයි.

- රෝස වගාව, තවාන් පාලනය, ශාක හඳුනාගැනීම, ශාක ප්‍රතිකාර ක්‍රම, මල් සැකසුම්, පශ්වාත් අස්වනු තාක්ෂණය, භූමි අලංකරණය සහ සෙසු ආශ්‍රිත විෂයයන් පිළිබඳව පුද්ගලයින් 12,709ක් පුහුණු කරන ලදී. මීට අමතරව ජෛව විවිධත්වය හා එහි සංරක්ෂණය පිළිබඳ පාසල් සිසුන් ඇතුළුව පුද්ගලයින් 220 ක් දැනුවත් කරන ලදී.



දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා ශාකාගාර තාක්ෂණික ක්‍රම හා කළමනාකරණය පිළිබඳ වැඩසටහනක් පවත්වමින්

- දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලද අතර අවශ්‍ය අවස්ථාවල දී දෙපාර්තමේන්තුවට පරිබාහිර ස්ථාන වල දී පුහුණුව දීමට කටයුතු කරන ලදී.
- කුඩා ළමුන් සඳහා වැඩසටහනක් ලෝක ළමා දිනය වෙනුවෙන් ඔක්.01 දා ස්වාධීන රූපවාහිනී සේවය සමඟ එක්ව පවත්වන ලදී.

## 5.8. මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය

| | |
|---|---|
| අනුමත ප්‍රතිපාදන:- ඒකාබද්ධ අරමුදල - රු. මි. 6* | |
| 2017 වර්ෂයේ වියදම | :-රු. මි. 5.982 |

*අනුමත ප්‍රතිපාදන සංශෝධනය වී ඇත.

- ක්ෂේත්‍ර කාර්යාල ගොඩනැගිල්ල අංක. 05 හි අලුත්වැඩියා කටයුතු සිදු කෙරුණු අතර එහි කටයුතු නිම කරන ලදී.
- පැළ රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර පැළ 37,970 ප්‍රමාණයක් නිපදවන ලදී.



ක්‍රියාත්මක පැළ රෝපණ වැඩසටහන

- මීට අමතරව ක්ෂේත්‍ර කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍රසූත්‍ර, කාර්යාලීය ලී බඩු හා වෙනත් අවශ්‍ය මෙවලම් මිලදී ගන්නා ලදී.

## 5.9. මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය, හම්බන්තොට

| |
|---|
| අනුමත ප්‍රතිපාදන**:** ඒකාබද්ධ අරමුදල - රු.මි. 74.2* |
| 2017 වර්ෂයේ වියදම : රු.මි. 73.205 |

*අනුමත ප්‍රතිපාදන සංශෝධනය වී ඇත

උද්භිද උද්‍යානයේ යටිතල හා මහජන පහසුකම් වැඩි දියුණු කිරීමේ අරමුණින් සංවර්ධන වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කෙරිණි.

- දැනට පවතින කාර්ය මණ්ඩලය නිල නිවාස 03 ට අමතරව අලුතින් නිල නිවාස 04 ක් සහිත සංකීර්ණයක ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතී. එහි පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලදී.




**දකුණු නව පිවිසුම් මාර්ගය අසල ඉදිකෙරුණු ගිම්හාන කුටියක්**

- උද්‍යානයේ සහ ප්‍රදේශයේ මල්වගා සංවර්ධන කටයුතු වැඩි දියුණු කිරීම සඳහා මල්වගා ප්‍රදර්ශන පැවැත්වීට මල්වගා ප්‍රදර්ශන මධ්‍යස්ථානයක් ඉදි කරන ලදී. පළමු අදියරෙහි ඉදිකිරීම් කටයුතු දැනට අවසන් කර ඇත.දෙවන අදියර ලබන වර්ෂයේ නිම කිරීමට බලාපොරොත්තු වේ.



**නව කාර්යාල ගොඩනැගිල්ල හා තොරතුරු මධ්‍යස්ථානය**

- උද්‍යානයේ ශාක ප්‍රචාරණ කටයුතු සඳහා අවශ්‍ය බීජ ගබඩා කිරීම සඳහා කාමරයක් ස්ථාපිත කිරීම් කටයුතු සිදුකරන ලද අතර වැඩ අවසන් වී ඇත.

- මව් ශාක එකතුවක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය සෙවන ගෘහයක් සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගත් අතර ඉදිකිරීම් කටයුතු සිදුකරන ලදී.

- නරඹන්නන්ගේ භාවිතය සඳහා නව භෝජනාගාරයක් ස්ථාපිත කිරීමේ කටයුතු හා නිල නිවාසයක ඉදිකිරීම් කටයුතු මෙම වසරේ දී අවසන් කරන ලදී.




**ඉදිකෙරෙමින් පවතින මල්වගා ප්‍රදර්ශන මධ්‍යස්ථානය**

- උද්‍යානයේ මාර්ගවල තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා කාපට් කිරීම සිදු කරන ලදී.

- අලුතින් ඉදිකරන ලද උද්‍යානයට ඇතුළුවීමේ නව ප්‍රවේශය ස්ථාපිත ප්‍රදේශයේ ගිම්හාන කුටි 02 ක් ස්ථාපිත කරන ලද අතර විධිමත් උද්‍යානයේ ගිම්හාන කුටි 04 ක් ඉදිකරන ලදී.

- උද්‍යානයේ භූදර්ශන ලක්ෂණ වැඩි දියුණු කිරීම සඳහා අලංකාර ශාක සහිත මල් උයන්, අඩිපාරවල්, මාවත් සහ අනෙකුත් උද්‍යාන අංග වැඩි දියුණු කරමින් ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු ද සිදු කරන ලදී.




**විධිමත් උද්‍යානයේ සංවර්ධිත ජල අපවහන පද්ධතිය**

- ප්‍රදේශයේ මල්වගාකරුවන් හට පහසුකම් සැපයීම සඳහා උද්‍යානයේ මල්වගා සංවර්ධන කටයුතු වැඩි දියුණු කර ඇත. උද්‍යානයේ සජීවී ශාක එකතුව වැඩි දියුණු කර ඇති අතර මල්වගා ව්‍යාප්ති කාර්යාලයේ




**අලුතින් ඉදිකරන ලද නිල නිවාස 04 ක් සහිත සංකීර්ණය- අවසන් කරන ලද පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු**

පහසුකම් වැඩි දියුණු කර ඇත. ප්‍රදේශයේ මල්වගාකරුවන් දිරිගැන්වීම සහ හැකියා වර්ධනය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම, වැඩමුළු හා පුහුණු සැසි ද පවත්වන ලදී.




අලුතින් ඉදිකරන ලද උද්‍යානයේ ප්‍රරෝහණ ඒකකය හා ගබඩාව

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව ශක්තිමත් කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 43,414 පැළ ප්‍රමාණයක් නිපදවන ලදී.




දක්ෂිණ ප්‍රවේශ දොරටුවේ රථ ගාල අසල මාර්ගය කාපට් ඇතිරීම

- නව කාර්යාලයක්, කුඩා ශාකාගාරයක්, සාකච්ඡා කාමරයක්, පුස්තකාලයක් සමඟ නරඹන්නන් සඳහා මධ්‍යස්ථානයක් දකුණු දොරටුව අසල ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද අතර එහි පළමු අදියරේ වැඩ කටයුතු දැනට අවසන් වී ඇත.
- උද්‍යානයේ විදුලි පරිභෝජනයට වැය වන අධික මුදල අවම කර ගැනීමට සූර්ය කෝෂ පද්ධතියක්, ගොඩනැගිලි සහ අනෙකුත් ආකෘති සඳහා විදුලිය සැපයීම සඳහා සවි කිරීමේ කටයුතු සිදු කිරීමට අවශ්‍ය ටෙන්ඩර් කැඳවීම් කටයුතු සිදු කෙරුණු අතර 2018 වසරේ ස්ථාපිත කිරීම් සිදු කරනු ඇත.



ප්‍රදේශයේ මල්වගාකරුවන් දිරිගැන්වීම සහ ධාරිතා වර්ධනය සඳහා පුහුණු සැසි පවත්වමින්


- උද්‍යානයට අවශ්‍ය ශාක නාම පුවරු, විස්තරාත්මක පුවරු හා මාර්ගෝපදේශ සපයන පුවරු සවි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදී.

- උද්‍යානයේ මැද වැව කොටසේ සහ විධිමත් උද්‍යානයේ ජල අපවහනය කාර්යක්ෂම කිරීම සඳහා කාණු සහ ඇල මාර්ග සකසන ලදී.
- උද්‍යානයේ නව ප්‍රවේශය සහිත දකුණු කොටසේ රථගාල සංවර්ධන කටයුතු සිදු කරන ලද අතර වැඩ අවසන් කරන ලදී.

## 5.10. සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල

| | |
|---|---|
| අනුමත ප්‍රතිපාදන **:** ඒකාබද්ධ අරමුදල - | රු. මි. 25.45 |
| උද්භිද උද්‍යාන භාරකාර අරමුදල - | රු.මි.2.403* |
| 2017 වර්ෂයේ වියදම | : රු.මි. 27.663 |

*අනුමත ප්‍රතිපාදන සංශෝධනය වී ඇත.



වැව ආශ්‍රිතව ඉදිකරන ලද බෝට්ටු අංගනය හා ජැටිය

උද්‍යානයේ නරඹන්නන් සඳහා පහසුකම් උද්‍යානය තුළ ඇතිකිරීම, නඩත්තු කටයුතු ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාම සඳහා විවිධ සංවර්ධන කටයුතු සිදු කරන ලදී.

- උද්‍යානයට පැමිණෙන නරඹන්නන් හට පහසුකම් සැපයීමේ අරමුණින් වැව ආශ්‍රිතව බෝට්ටු අංගනයක් හා ජැටියක් ඉදිකරන ලදී.
- රෝස උයන හා ජපන් උයන අසල ගිම්හාන කුටි 02ක් හා මීවන උයන අසල නව ගිම්හාන කුටියක ඉදිකිරීම් කටයුතු නිම කරන ලදී.
- උද්‍යානය තුළ පානීය ජල පද්ධතියක් ස්ථාපනය කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින අතර ජල පොම්පාගාරය අලුත්වැඩියා කිරීම සිදුකරන ලදී.
- උද්‍යානය වටා ආරක්ෂිත වැටෙහි කොටසක් ස්ථාපනය කිරීම් කටයුතු නිම කරන ලදී.



ජපන් උයන අසල නිම කරන ලද ගිම්හාන කුටිය

- නව වැසිකිළි පද්ධතියක ඉදි කිරීම් කටයුතු සිදුකර අවසන් කරන ලදී.
- උද්‍යානයේ මල්වගා කටයුතු වැඩිදියුණු කිරීමේ අරමුණින් ඇන්තූරියම් හා ඕකිඩ් පැළ තවාන සහිත සෙවන ගෘහ උද්‍යානයේ පැළ තවාන් පිහිටි ප්‍රදේශය වෙත විතැන් කරන ලදී.



ඉදි කිරීම් කටයුතු සිදුකරමින් පවතින නව වැසිකිළි පද්ධතිය

- උද්‍යානයේ භූදර්ශන ලක්ෂණ වැඩි දියුණු කිරීම සඳහා අලංකාර ශාක සහිත මල් උයන්, අඩිපාරවල්, මාවත් සහ අනෙකුත් උද්‍යාන අංග වැඩිදියුණු කරමින් ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු ද සිදු කරන ලදී.
- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව ශක්තිමත් කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 61,248 පැළ ප්‍රමාණයක් නිපදවන ලදී.



උද්‍යානයේ භූදර්ශනීය ලක්ෂණ වැඩි දියුණු කිරීම් කටයුතු

- උද්‍යානයේ ප්‍රවර්ධන කටයුතු සඳහා මාර්ග දෙපස, උද්‍යානයේ තොරතුරු ඇතුළත් පුවරු ස්ථාපිත කිරීම් කටයුතු නිම කරන ලදී.

සියලු උද්‍යානයන් හි කාර්යක්ෂම කළමනාකරණය සඳහා අවශ්‍ය නව යන්ත්‍රසූත්‍ර, උපකරණ සහ උද්‍යාන මෙවලම් යනාදිය මිලදී ගත් අතර පවතින යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ද වැඩිදියුණු කිරීම තුළින් උද්‍යාන අලංකාරය උසස් මට්ටමකින් පවත්වාගෙන යන ලදී.

# 6. දෙපාර්තමේන්තුව යටතේ සෙසු ඒකකවල කළමනාකරණය

## 6.1. අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අගමැතිතුමාගේ නිල නිවාස

අතිගරු ජනාධිපතිතුමාගේ කොළඹ 01 හි පිහිටි ජනාධිපති මන්දිරය, මහනුවර, නුවරඑළිය, අනුරාධපුරයේ මන්දිරබද උද්‍යාන සහ ගරු අගමැතිතුමාගේ කොළඹ අරලියගහ මන්දිරය සහ නුවරඑළියේ පිහිටි නිල නිවාසබද උද්‍යාන උසස් ලෙස නඩත්තු කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අගමැතිතුමාගේ නිල නිවාසබද උද්‍යානවල අලංකරණය සහ සැලසුම් කළ පරිදි තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා සංවර්ධන කටයුතු දියත් කෙරිණි.



අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ සෞඛ්‍ය තත්ත්වය මනා ලෙස පවත්වාගෙන යාමට කටයුතු ද සිදු කරමින්

## 6.2. අනුරාධපුර ශ්‍රී මහා බෝධිය

ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ සෞඛ්‍ය තත්ත්වය සොයා බැලීමේ කටයුතු සඳහා පියවර ගැනීම මෙන් ම බෝධීන් වහන්සේගේ සෞඛ්‍ය තත්ත්වය පවත්වාගෙන යාමේ කටයුතු සඳහා මෙම වසරේදී ද පියවර ගන්නා ලදී.

## 6.3. පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක

මහනුවර, ජාවත්ත, බොරැල්ල සහ ත්‍රිකුණාමලය යන ස්ථානයන් හි පිහිටි පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක වල නඩත්තු කටයුතු හා කළමනාකරණ කටයුතු ඉහළ මට්ටමක පවත්වාගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු සිදුකරන ලදී.



ජාවත්ත හි පිහිටි පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන

## 6.4. උද්භිද උද්‍යාන භාර අරමුදල

උද්භිද උද්‍යාන සංවර්ධනය සහ සුභසාධනය සඳහා වූ උද්භිද උද්‍යානභාර අරමුදල 1996 පෙබරවාරි 07 දින කැබිනට් අනුමැතියෙන් ආරම්භ කරන ලද්දේ 1995 දෙසැම්බර් 15 වැනි දින කෘෂිකර්ම, ඉඩම් සහ වන සම්පත් ඇමති වෙත ඉදිරිපත් කරන ලද කැබිනට් සටහන් පත්‍රිකාව සැලකිල්ලට ගනිමිනි.

උද්භිද උද්‍යානවල වාර්ෂික ආදායමෙන් 25% උද්භිද උද්‍යානය වැඩිදියුණු කිරීම සහ එහි සුභසාධනය සඳහා උද්‍යාන භාරකාර අරමුදල වෙත වෙන් කිරීමක් වන අතර මෙය මෙම අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය වේ. උද්භිද උද්‍යානවල සංවර්ධන කටයුතු සඳහා මූල්‍යමය ආධාර සැපයීම මෙම අරමුදලේ ප්‍රධාන අරමුණ වන අතර අනෙකුත් අරමුණු පහත පරිදි වේ.

- උද්භිද උද්‍යාන ශ්‍රී ලංකාවේ මෙන් ම විදේශ රටවල ද ප්‍රවර්ධනය කිරීම.
- අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම  සහ පැළෑටි සංරක්ෂණය කිරීම.
- උද්‍යානයන්හි පහසුකම් වැඩි දියුණු කිරීම සහ උපකරණ මිළදී ගැනීම සඳහා මූල්‍යමය ආධාර සැපයීම.
- උද්භිද උද්‍යානවල සංවර්ධනය මෙන් ම තාක්ෂණික, අධ්‍යාපනික සහ පුහුණු ක්‍රියාදාමයන් වැඩි දියුණු කිරීම සඳහා මූල්‍යමය ආධාර සැපයීම.
- උද්භිද උද්‍යානයට පැමිණෙන විද්‍යාඥයින් සහ විශේෂ නියෝජිතයින් සඳහා පහසුකම් සැපයීම සඳහා කඩිනම් ඉදිකිරීම් හෝ නඩත්තු කටයුතු සිදු කිරීම.
- සැලසුම් කරන ලද විශේෂ වූ වැඩසටහනකට අවශ්‍ය පුනරාවර්තන වියදම ආවරණය කිරීම.

උද්‍යාන භාරකාර අරමුදලේ මූල්‍යමය සහාය යටතේ 2017 වර්ෂයේ දී උද්‍යානවල සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලද අතර එය උද්‍යානවල තත්ත්වය ඉහළ මට්ටමක පවත්වා ගැනීමට විශාල දායකත්වයක් සපයන ලදී .

2017 වර්ෂය සඳහා උද්‍යානභාරකාර අරමුදලේ වාර්ෂික ප්‍රාග්ධන වෙන්කිරීම්  රුපියල් මිලියන 150 ක් වූ අතර උද්භිද උද්‍යාන සංවර්ධනය සඳහා එයින් රුපියල් මිලියන 149.8 (99.9%) වැය කර ඇත.

# 7. 2017 වර්ෂය තුළ තනතුරු ඇති කිරීම්, බඳවා ගැනීම්, ස්ථාන මාරු, මුදා හැරීම්, විශ්‍රාම ගැනීම් සහ මිය යාම්

## 7.1. තනතුරු ඇතිකිරීම්

| තනතුර | 2017 වසරේ අනුමත තනතුරු සංඛ්‍යාව | අනුමත මුළු තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | 1 | 1 |
| ශාස්ත්‍ර අයකිරීම් සහකාර | 3 | 26 |
| උද්‍යාන කම්කරු | 160 | 563 |
| ගබඩාකරු | 2 | 5 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 3 | 6 |
| බැකෝ යන්ත්‍ර ක්‍රියාකරු | 1 | 1 |
| බැටරි කාර් ක්‍රියාකරු | 19 | 19 |

## 7.2. බඳවා ගැනීම්

| තනතුර | පැවති පුරප්පාඩු ගණන | 2017 බඳවා ගැනීම් |
|---|---|---|
| සංවර්ධන නිලධාරී | 10 | 6 |

## 7.3. ස්ථාන මාරු

| තනතුර | දෙපාර්තමේන්තුවට පැමිණි සංඛ්‍යාව | දෙපාර්තමේන්තුවෙන් පිටතට ගිය සංඛ්‍යාව |
|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | 1 | - |
| ගණකාධිකාරී | 1 | - |
| පරිපාලන නිලධාරී | 1 | 1 |
| වැඩසටහන් සහකාර | - | 1 |
| සංවර්ධන නිලධාරී | 1 | 1 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 6 | 4 |
| රියදුරු | 3 | 2 |
| කාර්යාල කාර්ය සහායක | 3 | - |
| **එකතුව** | **16** | **9** |

## 7.4. මුදා හැරීම් සහ සේවය අතහැර යාම්

| තනතුර | මුදා හැරීම් | සේවය අතහැර යාම් |
|---|---|---|
| සංවර්ධන නිලධාරී | 1 | **-** |
| ශාස්ත්‍ර අයකිරීම් සහකාර | 1 | **-** |
| උද්‍යාන වැඩ මූලික | 1 | 1 |
| උද්‍යාන කම්කරු | **-** | 3 |
| **එකතුව** | **3** | **4** |

## 7.5. විශ්‍රාම ගැනීම් සහ මිය යාම්

| තනතුර | විශ්‍රාම ගැනීම් | මිය යාම් |
|---|---|---|
| උද්‍යාන සංවර්ධන සහකාර(විශේෂ) | 1 | - |
| උද්‍යාන සංවර්ධන සහකාර/ කෘෂි උපදේශක | 3 | - |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 3 | - |
| ගාස්තු අයකිරීම් සහකාර | - | 1 |
| රියදුරු | 1 | - |
| මුරකරු | 1 | - |
| උද්‍යාන කම්කරු | 8 | 2 |
| **එකතුව** | **17** | **3** |

# 8. කාර්ය මණ්ඩල පුහුණුව සහ හැකියාව ගොඩනැංවීම

## 8.1. කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් (විදේශීය)

| අංකය | වැඩසටහන | රට | කාල සීමාව | විදේශගත වූ නිලධාරීන් |
|---|---|---|---|---|
| 1. | *Liriodendron* සහ *Camphor* යන ශාකවල ජාන සම්පත් භාවිතය සහ නවෝත්පාදන පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩමුළුව | චීනය | 22/ 07 /2017 - 07/ 08 /2017 | ආර්.ඩී.ඩොනිල් කුලරත්න මහතා, කාර්යභාර නිලධාරි, හක්ගල උද්භිද උද්‍යානය |
| 2. | 6 වන දකුණු නැගෙනහිර ආසියාතික උද්භිද උද්‍යාන ජාල සම්මන්ත්‍රණය | වියට්නාමය | 24 - 28 / 04/ 2017 | ඊ.එම්.එස්.ඒකනායක මහතා, කාර්යභාර නිලධාරි, මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය |
| 3. | කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන | තායිලන්තය | 19 – 26 /03/ 2017 | එම්.ටී.යූ.ද මෙල්, ප්‍රධාන ගණකාධිකාරි, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව |
| 4. | ශාක විද්‍යාත්මක පර්යේෂණ වල ශාක වර්ගීකරණ මූලධර්ම හා මෙවලම් පිළිබඳ පුහුණු වැඩමුළුව | එක්සත් රාජධානිය | 05 – 13/ 03 / 2017 | එන්.පී.ටී.ගුණවර්ධන මිය, කෘෂි මෙහෙයුම් නිලධාරි, ජාතික ශාකාගාරය |
| 5. | පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | ඉන්දියාව | 27/ 02 /2017 – 04 / 03/ 2017 | ඊ.ඩබ්.එස්.ඩී.ඩී.විජේසේකර, කාර්යභාර නිලධාරි, සහකාර අධ්‍යක්ෂ කාර්යාලය, නාරාහේන්පිට |

## 8.2. කාර්ය මණ්ඩල නිලධාරීන් බාහිර ආයතන වෙතින් ලද පුහුණු (දේශීය)

| අනු අංකය | පුහුණු වැඩසටහන | පැවැත්වූ ස්ථානය | දිනය | ඉලක්කගත කණ්ඩායම |
|---|---|---|---|---|
| 01. | පෞද්ගලික ලිපි ගොනුවක් පවත්වාගෙන යාම | නිපුණතා සංවර්ධන අරමුදල (SDFL) | 2017.06.19-2017.06.20 | සංවර්ධන සහකාර රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 02. | වාහන කළමනාකරණය | ඉදිකිරීම් කර්මාන්ත හා සංවර්ධන ආයතනය | 2017.06.28 | වාහන භාර නිලධාරීන් වාහන විෂය භාර අධීක්ෂණ නිලධාරීන් අභ්‍යන්තර විගණන අංශවල නිලධාරීන් |
| 03. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය හා වත්කම් අපහරණය | නිපුණතා සංවර්ධන අරමුදල (SDFL) | 2017.06.29-2017.06.30 | ගබඩා කළමනාකරණය හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය අදාල විෂය භාර නිලධාරීන් |
| 04. | අවදානම් තක්සේරුව විගණන සැලසුම හා අභ්‍යන්තර පාලනය | ඉදිකිරීම් හා කර්මාන්ත සංවර්ධන ආයතනය | 2017.08.03 | විගණන නිලධාරීන් |
| 05. | ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම | සිටි ගාඩ්න්ස් ආයතනය | 2017.08.26 | ගෙවතුකරුවන් ගෙවතු අලංකරණකරුවන් පාඨමාලා මෙහෙයවන්නන් |
| 06. | තොරතුරු දැනගැනීමේ පනත | නිපුණතා සංවර්ධන අරමුදල (SDFL) | 2017.10.26 | අධීක්ෂණ මට්ටමේ කළමනාකරුවන් |
| 07. | සේවා විශිෂ්ටත්වය සඳහා රාජ්‍ය අංශයේ හැකියා වර්ධනය | ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනය | 2017.10.20 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන්, ශ්‍රී ලංකා වාස්තු විද්‍යා සේවයේ නිලධාරීන් |

## 9. 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම

| වැඩසටහන්/ක්‍රියාකරකම් | ප්‍රතිපාදන (රුපියල් මිලියන) | අරමුදල් මූලාශ්‍රය |
|---|---|---|
| **පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යාන සංවර්ධන වැඩසටහන** | | |
| ගොඩනැගිලි, නිල නිවාස, යන්ත්‍රෝපකරණ සහ වාහන අලුත්වැඩියා කටයුතු | 6.6 | ඒකාබද්ධ අරමුදල් |
| නව ආම්පන්න, කාර්යාලීය උපකරණ හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 5.3 | ඒකාබද්ධ අරමුදල් |
| සේවකයින් සඳහා නව වැසිකිළියක් ස්ථාපිත කිරීම | 0.40 | ඒකාබද්ධ අරමුදල් |
| පාරවල් දෙපස ගැටි බැමි යෙදීම | 1.0 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ස්ථාපිත ශාක සංරක්ෂණාගාරයෙහි අභ්‍යන්තර ආකෘති නිර්මාණය (ii) අදියර | 5.0 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම (ii) අදියර | 2.0 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ශාක එකතුන් වැඩි දියුණු කිරීම සහ විතැන් සංරක්ෂණ කටයුතු | 4.9 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| CCTV කැමරා පද්ධති සවි කිරීම | 3.0 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ශාක ලේබල්, විස්තරාත්මක පුවරු සහ දර්ශන පුවරු සවි කිරීම | 6.0 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| පැළ තවාන් වැඩි දියුණු කිරීම | 5.5 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| පානීය ජලය සඳහා අලුතින් ජල ටැංකියක් ස්ථාපිත කිරීම | 0.25 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| විශාල ප්‍රමාණයේ බැටරි කාරයක් මිලදී ගැනීම | 3.0 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ගරාජයක් ස්ථාපිත කිරීම | 0.70 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| පැළ අලෙවිහල වැඩි දියුණු කිරීම සහ උද්‍යාන බංකු ස්ථාපිත කිරීම | 1.50 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| රථවාහන නැවතුම්පල වැඩි දියුණු කිරීම | 5.0 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ඉඩම් වැඩි දියුණු කිරීම හා නඩත්තු කටයුතු | 4.50 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| මාර්ගෝපදේශ පත්‍රිකා හා තොරතුරු පත්‍රිකා මුද්‍රණය | 2.0 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකිරීම | 0.5 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| මා ඔය ජල සැපයුමේ සංවර්ධන කටයුතු | 2.0 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| පර්ගෝලාව සහ නිල නිවාස අලුත්වැඩියාව | 7.5 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| කැෆටේරියා ආයතනයේ ජල අපහරණ පද්ධතිය වැඩි දියුණු කිරීම හා වහල අලුත්වැඩියාව | 8 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| **මුළු එකතුව** | **74.65** | |
| **හක්ගල උද්භිද උද්‍යාන සංවර්ධන වැඩසටහන** | | |
| නිලධාරි නිලනිවාසය ඉදිකිරීම (අදියර ii) | 9.00 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම | 10.00 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| බීජ තැන්පත් කිරීම සඳහා කාමරයක් ඉදිකිරීම | 8.00 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ශාක එකතුන් වැඩි දියුණු කිරීම හා ශාක සංරක්ෂණ කටයුතු | 4.50 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ශාක ලේබල්,නාම පුවරු,විස්තරාත්මක පුවරු සවි කිරීම | 0.50 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ඉඩම් වැඩි දියුණු කිරීම හා නඩත්තු කටයුතු | 8.50 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| රථගාල සංවර්ධනය | 10.00 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| චේන් ලින්ක් වැට ඉදිකිරීම | 10.00 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| පැරණි ගිම්හාන කුටි වහල අලුත්වැඩියාව | 0.50 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |

| වැඩසටහන්/ක්‍රියාකරකම් | ප්‍රතිපාදන (රුපියල් මිලියන) | අරමුදල් මූලාශ්‍රය |
|---|---|---|
| ගොඩනැගිලි,නිල නිවාස,යන්ත්‍රෝපකරණ,වාහන අලුත්වැඩියාව | 1.5 | ඒකාබද්ධ අරමුදල් |
| නව ආම්පන්න, කාර්යාලීය උපකරණ හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 0.7 | ඒකාබද්ධ අරමුදල් |
| නව පිවිසුමෙහි ගිම්හාන කුටියක් ඉදිකිරීම | 1.6 | ඒකාබද්ධ අරමුදල් |
| පැළ අලෙවි සලක් ඉදිකිරීම | 1.0 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| **එකතුව** | **65.8** | |
| **ගම්පහ උද්භිද උද්‍යාන සංවර්ධන වැඩසටහන** | | |
| ජල අපවහන පද්ධති හා ගොඩනැගිලි අලුත්වැඩියාව | 1.5 | ඒකාබද්ධ අරමුදල් |
| නව ආම්පන්න,කාර්යාලීය උපකරණ හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 0.85 | ඒකාබද්ධ අරමුදල් |
| ක්ෂේත්‍ර සේවකයින් සඳහා වැඩපොලක් ඉදිකිරීම(අදියරii) | 8.0 | ඒකාබද්ධ අරමුදල් |
| පලතුරු උයනෙහි නව ගිම්හාන කුටියක් ඉදිකිරීම | 1.0 | ඒකාබද්ධ අරමුදල් |
| උද්‍යානයට යාබද අත්තනගලු ඔය ඉවුර සංරක්ෂණය | 4.0 | ඒකාබද්ධ අරමුදල් |
| ශාක එකතූන් වැඩි දියුණු කිරීම සහ සංරක්ෂණ කටයුතු | 1.5 | ඒකාබද්ධ අරමුදල් |
| පැළ තවාන වටා චේන් ලින්ක් වැටක් ඉදිකිරීම | 2.5 | ඒකාබද්ධ අරමුදල් |
| ශාක නාම පුවරු,දර්ශන පුවරු සවි කිරීම | 1.0 | ඒකාබද්ධ අරමුදල් |
| ඉඩම් වැඩි දියුණු කිරීම් සහ නඩත්තු කටයුතු සිදු කිරීම | 2.00 | ඒකාබද්ධ අරමුදල් |
| සූර්ය බලශක්ති පද්ධති ස්ථාපිත කිරීම(අදියරii) | 3.00 | ඒකාබද්ධ අරමුදල් |
| ආරක්ෂිත වැට ප්‍රතිසංස්කරණය | 3.00 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ගස් ගෙදර ප්‍රතිසංස්කරණය | 1.00 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ඕකිඩ් ප්‍රදර්ශන ගෘහය ඉදිකිරීම් කටයුතු නිම කිරීම | 5.00 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| මල් ආකෘති ස්ථාපිත කිරිම | 1.25 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| **එකතුව** | **35.6** | |
| **මල්වගා සංවර්ධන වැඩසටහන** | | |
| පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සහ මල්වගා සංවර්ධන අංශයේ පර්යේෂණාගාරයේ විවිධ නඩත්තු කටයුතු | 5.0 | ඒකාබද්ධ අරමුදල් |
| මල්වගා සම්බන්ධ අත් පත්‍රිකා, පුවත්පත් ප්‍රකාශයට පත් කිරීම | 1.00 | ඒකාබද්ධ අරමුදල් |
| මල් ප්‍රදර්ශන/ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම | 2.00 | ඒකාබද්ධ අරමුදල් |
| රෝපණ ද්‍රව්‍ය සැපයීම මඟින් වගාකරුවන්ට සහාය ලබා දීම | 15.00 | ඒකාබද්ධ අරමුදල් |
| පැළ තවාන් සහ වැවිලි ප්‍රදේශ දියුණු කිරීම | 11.00 | ඒකාබද්ධ අරමුදල් |
| පැළ විකිණීම සහ සිටුවීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම | 3.00 | ඒකාබද්ධ අරමුදල් |
| සූර්ය බලශක්ති පද්ධති ස්ථාපිත කිරීම | 15.00 | ඒකාබද්ධ අරමුදල් |
| සුවහස් මල් සෙවන පරිශ්‍රය සංවර්ධන කටයුතු | 0.80 | ඒකාබද්ධ අරමුදල් |
| පුහුණු පන්ති පැවැත්වීම, අංශයේ නඩත්තු කටයුතු හා වෙනත් වියදම් | 6.7 | ඒකාබද්ධ අරමුදල් |
| මව්ශාක මිලදී ගැනීම | 1.0 | |
| **එකතුව** | **60.5** | |

| වැඩසටහන්/ක්‍රියාකරකම් | ප්‍රතිපාදන (රුපියල් මිලියන) | අරමුදල් මූලාශ්‍රය |
|---|---|---|
| **ගනේවත්ත වන ඖෂධ උයන සංවර්ධන වැඩසටහන** | | |
| නව ආම්පන්න, කාර්යාලීය උපකරණ හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 0.65 | ඒකාබද්ධ අරමුදල් |
| ශාක එකතුන් වැඩි දියුණු කිරීම සහ සංරක්ෂණ කටයුතු | 1.0 | ඒකාබද්ධ අරමුදල් |
| ශාක නාම පුවරු, විස්තරාත්මක පුවරු සවි කිරීම | 0.20 | ඒකාබද්ධ අරමුදල් |
| ඉඩම් වැඩි දියුණු කිරීම් කටයුතු සහ වෙනත් නඩත්තු කටයුතු | 4.3 | ඒකාබද්ධ අරමුදල් |
| දේශනාගාරය අසල ජලාපවහන පද්ධතිය වැඩි දියුණු කිරීම | 0.50 | ඒකාබද්ධ අරමුදල් |
| **එකතුව** | **6.65** | |
| **මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය සංවර්ධන වැඩසටහන** | | |
| කාර්යාලීය උපකරණ, යන්ත්‍රෝපකරණ හා අනෙකුත් ආම්පන්න මිලදී ගැනීම | 2.00 | ඒකාබද්ධ අරමුදල් |
| බැටරි කාර් මිලදී ගැනීම | 3.00 | ඒකාබද්ධ අරමුදල් |
| මල්වගා අංශය තුළ සේවක පහසුකම් සහිත ගොඩනැගිල්ලක් සහ ගබඩාවක් ස්ථාපිත කිරීම | 3.00 | ඒකාබද්ධ අරමුදල් |
| නව කාර්යාලීය ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු (අදියරii) | 13.00 | ඒකාබද්ධ අරමුදල් |
| නිල නිවසක් ඉදි කිරීම(අදියරii) | 9.00 | ඒකාබද්ධ අරමුදල් |
| මල්වගා ප්‍රදර්ශන ස්ථානයක් ස්ථාපිත කිරීම(අදියරii) | 5.00 | ඒකාබද්ධ අරමුදල් |
| පාරවල් සංවර්ධනය | 10.00 | ඒකාබද්ධ අරමුදල් |
| මල්වගා අංශයේ විද්‍යුත් පද්ධතිය වැඩි දියුණු කිරීම | 1.50 | ඒකාබද්ධ අරමුදල් |
| කසළ කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම | 3.00 | ඒකාබද්ධ අරමුදල් |
| උද්භිද උද්‍යානය තුළ ළමුන් සඳහා අංශයක් ස්ථාපිත කිරීම | 1.00 | ඒකාබද්ධ අරමුදල් |
| ශාක එකතුන් වැඩි දියුණු කිරීම හා සංරක්ෂණ කටයුතු | 1.00 | ඒකාබද්ධ අරමුදල් |
| ශාක නාම පුවරු, ප්‍රදර්ශන පුවරු හා සවිස්තරාත්මක පුවරු සවිකිරීම | 0.50 | ඒකාබද්ධ අරමුදල් |
| ඉඩම් වැඩි දියුණු කිරීම හා නඩත්තු කටයුතු | 6.5 | ඒකාබද්ධ අරමුදල් |
| දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 0.2 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| සූර්ය බලශක්ති පද්ධති ස්ථාපිත කිරීම | 2.55 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ආරක්ෂිත වැට ඉදිකිරීම් කටයුතු | 2.0 | ඒකාබද්ධ අරමුදල් |
| පර්යේෂණ මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භ කිරීම | 2.5 | ඒකාබද්ධ අරමුදල් |
| **එකතුව** | **65.75** | |
| **සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය සංවර්ධන වැඩසටහන** | | |
| කාර්යාලීය උපකරණ, යන්ත්‍රෝපකරණ හා අනෙකුත් ආම්පන්න මිලදී ගැනීම | 3 | ඒකාබද්ධ අරමුදල් |
| පැළ තවාන සඳහා සෙවන ගෘහයක් ඉදිකිරීම | 3 | ඒකාබද්ධ අරමුදල් |
| ආරක්ෂක කුටි ඉදිකිරීම | 0.2 | ඒකාබද්ධ අරමුදල් |
| ජලය ගබඩා කිරීම සඳහා ටැංකියක් ඉදිකිරීම | 0.8 | ඒකාබද්ධ අරමුදල් |
| විද්‍යුත් පද්ධතිය වැඩි දියුණු කිරීම | 2.5 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| අකුණු වැලැක්වීමේ පද්ධතිය ස්ථාපිත කිරීම | 3 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| පානීය ජල පද්ධතිය ස්ථාපිත කිරීම(අදියර II) | 2 | ඒකාබද්ධ අරමුදල් |

| වැඩසටහන්/ක්‍රියාකරකම් | ප්‍රතිපාදන (රුපියල් මිලියන) | අරමුදල් මූලාශ්‍රය |
|---|---|---|
| ශාක එකතුන් වැඩි දියුණු කිරීම හා සංරක්ෂණ කටයුතු | 0.5 | ඒකාබද්ධ අරමුදල් |
| ශාක නාම පුවරු, විස්තරාත්මක හා ප්‍රදර්ශන පුවරු සවිකිරීම | 0.1 | ඒකාබද්ධ අරමුදල් |
| ගරාජය, ගබඩාව හා ක්ෂේත්‍ර කාර්යාලයක් ඉදිකිරීම | 5 | ඒකාබද්ධ අරමුදල් |
| මල්වගා අංශයේ පාරවල් සංවර්ධනය | 3 | ඒකාබද්ධ අරමුදල් |
| ඉඩම් වැඩි දියුණුව හා නඩත්තු කටයුතු | 5.2 | ඒකාබද්ධ අරමුදල් |
| උද්‍යාන බංකු ස්ථාපිත කිරීම | 0.3 | ඒකාබද්ධ අරමුදල් |
| චේන් ලින්ක් වැට දීර්ඝ කිරීම | 3.5 | ඒකාබද්ධ අරමුදල් |
| **එකතුව** | **32.1** | |
| **මීගලෑව උද්භිද උද්‍යානය සංවර්ධන වැඩසටහන** | | |
| සෙවන ගෘහයක් ඉදිකිරීම | 2.0 | ඒකාබද්ධ අරමුදල් |
| මීගලෑව පරිශ්‍රය වටා විදුලි වැටක් ඉදිකිරීම | 1.5 | ඒකාබද්ධ අරමුදල් |
| පැළ විකුණුම් හලක් ඉදිකිරීම | 1.5 | ඒකාබද්ධ අරමුදල් |
| ජල සම්පාදන පද්ධතියක් ස්ථාපිත කිරීම | 1.0 | ඒකාබද්ධ අරමුදල් |
| අඩිපාරවල් හා ප්‍රධාන පාරවල් සංවර්ධනය සහ ඉඩම් වැඩි දියුණු කිරීම | 3 | ඒකාබද්ධ අරමුදල් |
| බංකු ඉදිකිරීම | 0.5 | ඒකාබද්ධ අරමුදල් |
| පැරණි ගොඩනැගිල්ල අලුත්වැඩියා කටයුතු නිම කිරීම | 0.5 | ඒකාබද්ධ අරමුදල් |
| **එකතුව** | **10** | |
| **ජාතික ශාකාගාරය සංවර්ධන වැඩසටහන** | | |
| ශාක ගවේෂණ වැඩසටහන | 2.50 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| පර්යේෂණ කටයුතු සහ ශාකාගාර නඩත්තු කටයුතු | 1.90 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ප්‍රකාශන සැකසීම හා මුද්‍රණය හා ග්‍රන්ථ මිලදී ගැනීම | 1.1 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| වැඩමුළු හා අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම | 2.50 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| පරීක්ෂණාගාර කාමර අංක 02 ශාක සඳහා තීරු සංකේත යෙදීම සිදු කිරීම හා ශාකාගාර නිදර්ශක රූපකරණය (Digitize) සඳහා වැඩි දියුණු කිරීම | 5 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| නව කාර්යාලීය ලී බඩු මිලදී ගැනීම | 0.2 | ඒකාබද්ධ අරමුදල් |
| **එකතුව** | **13.2** | |
| **අධ්‍යාපන හා පුහුණු සංවර්ධන වැඩසටහන** | | |
| පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම හා නඩත්තු කටයුතු | 2.00 | උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා පුහුණු වැඩසටහන්වලට සහභාගී කරවීම(දේශීය/විදේශීය) | 2.5 | ඒකාබද්ධ හා උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| **එකතුව** | **4.5** | |

| වැඩසටහන්/ක්‍රියාකරකම් | ප්‍රතිපාදන (රුපියල් මිලියන) | අරමුදල් මූලාශ්‍රය |
|---|---|---|
| **ප්‍රධාන කාර්යාලයේ වැඩි දියුණු කිරීම් කටයුතු හා උද්භිද උද්‍යානයන් හි අලංකරණ හා ප්‍රවර්ධන කටයුතු** | | |
| ප්‍රධාන කාර්යාලයේ වැඩි දියුණු කිරීම් | 3.4 | ඒකාබද්ධ හා උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| ප්‍රවර්ධන කටයුතු හා උද්භිද අලංකරණ කටයුතු | 15.15 | ඒකාබද්ධ හා උද්භිද උද්‍යාන භාර අරමුදල් |
| කාර්යාලීය ලී බඩු මිලදී ගැනීම් | 0.4 | ඒකාබද්ධ අරමුදල් |
| **එකතුව** | **18.95** | |
| **මුලු එකතුව** | **387.7** | |